ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අටවැනි පාර්ලිමේන්තුවේ
(පළමු සැසිවාරය)

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 118

**එලදායී තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ ආදායම එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන් විසින් සහ පාර්ශ්වකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ**

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ
## අතුරු වාර්තාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
**ගරු ලසන්ත අලගියවන්න මහතා**
විසින්

2016 නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

*මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් 2016 නොවැම්බර් මස 23 වැනි දින නියම කරන ලදී'*

**අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය**

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

01. ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)
02. ගරු එස්.බී. දිසානායක මහතා
03. ගරු මහින්ද සමරසිංහ මහතා
04. ගරු පී. හැරිසන් මහතා
05. ගරු ෆයිසර් මුස්තාපා මහතා
06. ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
07. ගරු නිරෝෂන් පෙරේරා මහතා
08. ගරු සුජීව සේනසිංහ මහතා
09. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
10. ගරු බන්දුල ගුණවර්ධන මහතා
11. ගරු විජිත හේරත් මහතා
12. ගරු වාසුදේව නානායක්කාර මහතා
13. ගරු නිහාල් ගලප්පත්ති මහතා
14. ගරු බිමල් රත්නායක මහතා
15. ගරු සේයිඩ් අලි සහීර් මවුලානා මහතා
16. ගරු බුද්ධික පතිරණ මහතා
17. ගරු සීනිතම්බි යෝගේෂ්වරන් මහතා
18. ගරු එස්. ශ්‍රීතරන් මහතා
19. ගරු චන්දිම ගමගේ මහතා
20. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
21. ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා
22. ගරු අයි. චාල්ස් නිර්මලනාදන් මහතා
23. ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
24. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
25. ගරු ප්‍රසන්න රණතුංග මහතා
26. ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා

## අනුකාරක සභාවේ සංයුතිය

01. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (සභාපති)

02. ගරු බන්දුල ගුණවර්ධන මහතා

03. ගරු සෙයිඩ් අලි සහීර් මවුලානා මහතා

04. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

05. ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| සභාපතිතුමාගේ පණිවිඩය | 1 |
| අ. වාර්තාව | 3 |
| අ 1-පසුබිම | 3 |
| අ 2-අනුකාරක සභාවේ යොමු කිරීමේ අනුදේශ | 3 |
| අ 3-අනුකාරක සභාව විසින් යොදා ගත් ක්‍රමවේදය | 3 |
| අ 4-නිරීක්ෂණ හා මූලික සාකච්ඡාවල ප්‍රතිඵල | 4 |
| අ 5-රාජ්‍ය ආදායමේ සංයුතිය | 6 |
| අ 6-රේගු දෙපාර්තමේන්තුව | 8 |
| නිරීක්ෂණ හා නිර්දේශ | 8 |
| අ 7-දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 12 |
| නිරීක්ෂණ හා නිර්දේශ | 12 |
| අ 8-ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | 15 |
| නිරීක්ෂණ හා නිර්දේශ | 15 |
| අ 9-අනෙකුත් නිරීක්ෂණ | 17 |
| අ 10-පොදු නිරීක්ෂණ | 20 |
| ආ. ඇමුණුම | |
| බී-1 කාරක සභාව සාකච්ඡා කළ කරුණු | 22 |
| බී 2 -ප්‍රශ්නාවලි හා පිළිතුරු | 44 |

## සභාපතිතුමාගේ පණිවිඩය

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුව මගින් පවරා ඇති මූල්‍ය අධීක්ෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ආයතන වල තොරතුරු තාක්ෂණය ක්‍රියාත්මක කිරීමේ යම් යම් අවාසි / දුර්වලතා නිරීක්ෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය ආදායම හා විනිවිදභාවය අහිමි වීම සහ විගණන ක්‍රියාවලිය තුළ දුෂ්කරතා ඇති වීම සිදු වේ. එම නිසා, කමිටුව විසින් රාජ්‍ය ආයතන වල කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ක්‍රමානුකූල ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. රජයේ ආදායම වැඩිදියුණු කිරීම, පාරිභෝගික හිතකාමී මෙහෙයුම් පද්ධතියක් ගොඩනැංවීම, කළමනාකරණ කාර්යක්ෂමතාව සහ විගණන පහසුව අරමුණු කරගත්, සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත අනු කාරක සභාවක් ගරු ඉරාන් වික්‍රමරත්න මහතාගේ සභාපතිත්වයෙන් පත් කරන ලදී. මෙම මුල්පිරීම මහජන විශ්වාසය හා යහ පාලනය පිළිබඳ සංකල්පය ආරක්ෂා කරන බවට කාරක සභාව අදහස් කරන ලදී.

රජයේ ආදායමට වැඩි දායකත්වයක් සපයන ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ රැස්වීම් කිහිපයක් සිදු කිරීමෙන් අනතුරුව අනු කාරක සභාව විසින් විශේෂ නිරීක්ෂණ හා ඉතා ඵලදායී හා කාලෝචිත නිර්දේශ අඩංගු වන සිය වාර්තාව අතුරු වාර්තාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි.

අනු කාරක සභාවේ සභාපති ගරු ඉරාන් වික්‍රමරත්න මහතා හා කමිටුවේ සෙසු සාමාජිකයන්ගේ කැපවීම මම බෙහෙවින් අගය කරමි. මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා සහයෝගය ලබා දුන් රජයේ ගිණුම් කාරක සභාවේ උපදේශක ලලිත් ආර්. ද සිල්වා මහතා, හිටපු රේගු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය නෙවිල් ගුණවර්ධන මහතා, සහ හිටපු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් මල්ලිකා සමරසේකර මහත්මියට මම ස්තුතිවන්ත වෙමි. තවද කාරක සභාව වෙත විශේෂඥ දැනුම ලබා දුන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ ලංකා ක්ලියර් (පුද්) සමාගමට මම ස්තුතිවන්ත වෙමි. තවද මා අපේක්ෂා කළ පරිදිම විවිධ අභියෝග මධ්‍යයේ වුවද කාරක සභාව වෙත නොමඳ සහයෝගය ලබාදුන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්, පාර්ලිමේන්තු සහකාර ලේකම්වරුන් හා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යංශ නිලධාරීන් මෙන්ම විගණකාධිපතිතුමා ඇතුළු ඔහුගේ කාර්ය මණ්ඩලයට ස්තූති කිරීමටද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

කාරක සභාවේ අරමුණු මුදුන්පත් කර ගනු වස් රජය මෙම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ඇති බව මම මේ අවස්ථාවේ දී සඳහන් කිරීමට කැමැත්තෙමි.

**ඵලදායී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ ආදායම එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන් විසින් සහ පාර්ශ්වකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පත් කරන ලද අනු කාරකසභාවේ වාර්තාව.**

## පසුබිම

පහත අත්සන් කර ඇති අප 2016 මාර්තු මස රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉහත අනු කාරක සභාවට පත් කරන ලදී. සවිස්තරාත්මක උපකාරක සභා හතකින් පසුව අනු කාරක සභාවට යොමු කර ඇති කාරණා සම්බන්ධයෙන් අපගේ වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. අනු කාරක සභාවේ යොමු කිරීම් අනුදේශයන්, අනු කාරක සභාව යොදාගත් ක්‍රමවේදය, එක් එක් කාරක සභා රැස්වීම් වල කරන ලද සාකච්ඡාවන්හි විස්තර සහ සොයාගැනීම් සහ ඒ සම්බන්ධ අපගේ නිරීක්ෂණ සහ තනි නියෝජිතායතන සහ ජාතික මට්ටමේ වැඩිදියුණු කිරීම් සඳහා වන අපගේ නිර්දේශ මෙහි ඉදිරිපත් කර තිබේ.

## අනු කාරක සභාවේ යොමු කිරීම් අනුදේශ

විනිවිදභාවයෙන් යුතුව පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය ඇතිවන ආකාරයට ව්‍යාපාර කරගෙන යාම පහසු කිරීම යන කාරණය ආමන්ත්‍රණය කරන අතරම ආදායම් කාන්දුවීම් අවම කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ සහාය සහිතව උපරිම කළමනාකාරිත්ව කාර්යක්ෂමතාවක් සහතික කිරීම සඳහා අදාළ රජයේ නියෝජිතායතන විසින් ගත යුතු පියවර සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

## අනු කාරක සභාව විසින් යොදාගත් ක්‍රමවේදය

අ) ප්‍රධාන ආදායම් උත්පාදන දෙපාර්තමේන්තු, රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ සේවා සපයන්නන්, ගෙවීම් සඳහා සේවා සපයන්නන් සහ රාජ්‍ය අංශයේ බැංකු අතර පොදු සාකච්ඡා සූදානම් කිරීම.

ආ) ඉලක්කගත අදායම් උත්පාදන දෙපාර්තමේන්තු සහ තෝරාගත් සම්බන්ධිත ක්‍රියාවලිය, සහායක නියෝජිතායතන සහ සේවා සපයන්නන් අරමුණු කරගනිමින් අන්තර්ක්‍රියකාරී සාකච්ඡා සූදානම් කිරීම.

ඇ) රැස්වීම් වලදී ඍජු ප්‍රශ්න සහ නිරීක්ෂණ ඉදිරිපත් කර ප්‍රතිචාර ලබා ගැනීම.

ඈ) අදාළ නියෝජිතායතන වල කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් තත්ත්ව වාර්තා ලබා ගැනීම.

ඉ) විශේෂිත පැහැදිළිකිරීම් ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි යැවීම.

## මූලික සාකච්ඡාවල ප්‍රතිඵල

පහත සඳහන් නියෝජිතායතන වල සහභාගිත්වයෙන් 2016 මාර්තු 24 සහ 2016 මැයි 03 අනු කාරක සභාව විසින් මූලික සාකච්ඡා දෙකක් පවත්වන ලදී.

- රේගු දෙපාර්තමේන්තුව
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- සුරාබදු දෙපාර්තමේන්තුව
- ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව
- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
- මෝටර් වාහන දෙපාර්තමේන්තුව
- ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව
- මුදල් අමාත්‍යාංශය
- පුද්ගලයන් ලියාපදංචි කිරීමේ දෙපාර්තමේන්තුව
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
- කොළඹ මහ නගර සභාව
- ලංකා බැංකුව
- මහජන බැංකුව
- තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය
- ලංකා ක්ලියර් සීමාසහිත සමාගම

සාකච්ඡා ආරම්භයේදී මෙම අනු කාරක සභාව පත් කිරීමට හේතුව සභාපතිවරයා පැහැදිළි කළ අතර එක් එක් නියෝජිතායතනයට තම නියෝජිතායතනවල කළමනාකරණ තොරතුරු පද්ධති යොදාගෙන ඇති ආකාරයත් ඔවුන් දැනට මුහුණ දෙන අභියෝග සහ බාධාවනුත් පිළිබඳ කෙටි ඉදිරිපත් කිරීමක් කරන ලෙසට ඉල්ලීමක් කරන ලදී. සංවිධානය තුළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදාගැනීම සම්බන්ධයෙන් වන වර්තමාන තත්ත්වය සහ එය වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය අනාගත සැළසුම් පැහැදිළි කරමින් ලිඛිත වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව විසින් අදාළ නියෝජිතායතන වලට නියෝග කරන ලදී. (විස්තර සඳහා බී-2 ඇමුණුම බලන්න)

ඉදිරියේදී අනුගමනය කිරීම සඳහා පහත සඳහන් නිරීක්ෂණ / යෝජිත පරාමිතීන් කාරක සභාවේ ඉදිරි සාකච්ඡා වලදී ඉදිරිපත් කරන ලදී.

- පවතින තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතිය උසස් මට්ටමකට පත්කිරීමෙන් හෝ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතිය තුළට නව ක්ෂේත්‍ර හඳුන්වාදීම තුළින් නියෝජිතායතනය විසින් සපයන සේවාවේ ගුණාත්මක බව ඉහළ දැමීමේ හැකියාව
- සන්නිවේදනය මාර්ගගත ආකාරයට සිදු වන විට එහි විනිවිදභාවය සාපේක්ෂ වශයෙන් ඉහළය.
- අනෙකුත් ගෙවීම් මාධ්‍ය ට සාපේක්ෂව විද්‍යුත් ගෙවීම් මාධ්‍ය සාපේක්ෂ වශයෙන් පහසු, ඵලදායී සහ කාලය ඉතිරි කරන සුළුය.
- යම් රජයේ ආයතන වල පවතින ක්‍රියා පටිපාටි අවහිරතා ඇති කරයි.
- තාක්ෂණික, කළමනාකරණ සහ පරිපාලන ගැටළු සම්බන්ධයෙන් රජයේ ආයතන තුළ අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යක්ෂම සහ ඵලදායී යාන්ත්‍රණයක අවශ්‍යතාව
- අතින් කරන කටයුතු තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ක්‍රමවේදයන්ට මාරු කරන අවසථාවේ අවශ්‍ය ස්ථානවල වැඩ ක්‍රියාවලි නැවත සකස් කිරීම.
- විගණන සහ අනෙකුත් නියාමන නියෝජිතායතන වලට තොරතුරු පහසු සහ විනිවිදභාවයෙන් යුතුව බෙදාහැරීම.

### රාජ්‍ය ආදායමේ සංයුතිය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා රාජ්‍ය ආදායමේ සංයුතිය පළමුව අධ්‍යයනය කිරීමට අනු කාරක සභාව තීරණය කළේය.

2015 වසරේ රජයේ ආදායම් එකතුවේ සංයුතිය - ආදායම් ගණනය කිරීමේ ශීර්ෂ වශයෙන් වර්ගීකරනය කර ඇති අතර ආදායම් අයිතම වශයෙන් උප වර්ගීකරණයක් සිදු කර ඇත.

### රජයේ ආදායම 2015

| දෙපාර්තමේන්තුවේ නම | ප්‍රතිශතය |
|---|---|
| රේගු දෙපාර්තමේන්තුව | 43.58 |
| දේශීය ආදායම් දෙපාර්තමේනතුව | 37.13 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 7.45 |
| **අනු එකතුව** | **88.16** |
| අනෙකුත් සියළු රජයේ දෙපර්තමේන්තු | 11.84 |
| **එකතුව** | **100.00** |

### ආදායම් උප වර්ගීකරණය

| දෙපාර්තමේන්තුවේ නම | ආදායම් අයිතමය | එහි එකතුවේ ප්‍රතිශතය |
|---|---|---|
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | |
| | ආයතනික ආදායම් බද්ද | 26.56 |
| | ආනයන මත එකතු කළ අගය මත බද්ද | 15.95 |
| | අනෙකුත් සේවා මත එකතු කළ අගය මත බද්ද | 14.05 |
| | පොළිය මත රඳවුම් බද්ද | 11.89 |
| | නිෂ්පාදනය මත එකතු කළ අගය මත බද්ද | 5.51 |
| | මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද | 5.32 |
| | ආයතනික නොවන උපයන විට ගෙවීමේ බද්ද | 4.99 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද -සේවා | 4.05 |
| | **අනු එකතුව** | **88.32** |
| | අනෙකුත් සියළුම ගාස්තු | 11.68 |
| | **එකතුව** | **100.00** |

**රේගු දෙපාර්තමේන්තුව**

| | |
|---|---|
| මෝටර් වාහන මත නිෂ්පාදන බදු | 36.28 |
| ආනයන බදු | 17.55 |
| දුම්වැටි මත නිෂ්පාදන බදු | 12.99 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු | 9.21 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 8.49 |
| පෙට්‍රෝලියම් නිෂ්පාදන මත නිෂ්පාදන බදු | 7.32 |
| ආනයන සෙස් බද්ද | 6.90 |
| **අනු එකතුව** | **98.74** |
| අනෙකුත් සියළුම අයිතම 9 | 1.26 |
| **එකතුව** | **100.00** |

**සුරාබදු දෙපාර්තමේන්තුව**

| | |
|---|---|
| මත්පැන් මත සුරාබදු | 99.97 |
| දුම්කොළ බද්ද | 0.03 |
| **එකතුව** | **100.00** |

*මූලාශ්‍රය :රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව -දිවයිනේ ගිණුම් 2015*

රාජ්‍ය ආදායමේ සංයුතිය, මූලාශ්‍ර සහ එය එකතු කිරීමට මූලිකව වගකියනු ලබන නියෝජිතායතන සම්බන්ධයෙන් අධ්‍යනය කළ අනුකාරක සභාව තම අධ්‍යනයන් ප්‍රධාන දෙපාර්තමේන්තු තුන වන ශ්‍රී ලංකා රේගුව ,දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමට තීරණය කරන ලදී .එසේම ආනයන අපනයන ක්‍රියාවලියට ඍජුවම සම්බන්ධ වන හෝ වැඩිදියුණු කිරීම් සඳහා වැදගත් තොරතුරු ලබා ගැනීමට භාවිතා කළ හැකි තවත් ආයතන කිහිපයක් ද කැඳවීමට ද අනු කාරක සභාව තීරණය කළේය. අනු කාරක සභාව එවන් අන්තර්ක්‍රියාකාරී සැසි පහක් පැවැත්වූ අතර තවදුරටත් පැහැදිළි කරගැනීම් සිදුවිය .එහිදී රැස්කරගත් තොරතුරු විමර්ශනය සඳහා මෙහි දක්වා ඇත. (ප්‍රශ්නාවලි සඳහා ලැබුණු පිළිතුරු සඳහා බී-1 ඇමුණුම බලන්න.)

තෝරාගත් දෙපාර්තමේන්තු තුන සම්බන්ධයෙන් අනු කාරක සභාවේ අධ්‍යනයන්ගේ ප්‍රතිඵල මතු දැක්වේ.

## රේගු දෙපාර්තමේන්තුව

රාජ්‍ය ආදායමේ සම්පූර්ණ එකතුවෙන් 50.62% ක් (එකතු කළ අගය මත ආනයන බදු සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් එකතු කළ ජාතිය ගොඩනැගීමේ බදු ද ඇතුළුව) වන වැඩිම ප්‍රතිශතය 2015 වසරේදී රේගු දෙපාර්තමේන්තුව විසින් රැස් කර ඇති බව අවධානයට යොමුවිය .මෙම ආදායම ප්‍රධාන වශයෙන්ම එකතු කර ගෙන ඇත්තේ ආනයනික භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේ රේගු බදු වශයෙන් සහ නිෂ්පාදන (විශේෂ විධි විධාන)පනත යටතේ නිෂ්පාදන බදු, එකතු කළ අගය මත බදු, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු, අපනයන සංවර්ධන පනතේ සෙස් බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද යනුවෙනි .නිෂ්පාදන (විශේෂ විධි විධාන) පනත යටතේ වන දුම්වැටි, පෙට්‍රෝලියම් නිෂ්පාදන ආදී දේශීය වශයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ සම්බන්ධයෙනුත් නිෂ්පාදන බදු එකතුකිරීමේ වගකීම රේගුව සතුවේ.

ආදායම් එකතු කිරීමට අමතරව සමාජ, සෞඛ්‍ය, පාරිසරික සහ ආරක්ෂාවට අදාළ වගකීම් ඉෂ්ට කිරීම සඳහා අදාළ ව්‍යවස්ථාපිත ආයතන වල සහාය සහිතව ආනයන සහ අපනයන සම්බන්ධයෙන් වන සීමා සහ තහනම් වලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද රේගුව සතුව වගකීමක් තිබේ.

ආනයන මත ඇති අධික ආදායම් එකතුව හඳුනාගත් අනු කාරක සභාව රේගුවේ ඇති කළමනාකරණ පද්ධතියේ වර්තමාන තත්ත්වය හඳුනාගැනීම සහ එමගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඵලදායී ලෙස යොදාගැනීම සඳහා රේගුවේ ආනයන නිරවුල් කිරීමේ ක්‍රියාවලිය වෙත තම අවධානය යොමු කිරීමට අනු කාරක සභාව තීරණය කළේය .

එමනිසා අනු කාරක සභාව තොරතුරු සන්නිවේදන තාක්ෂණ යෙදවුම් වල ප්‍රගතියත් රේගුවේ අවදානම් කළමනාකරණ පද්ධතියත්, ආනයන සීමා සහ තහනම් කිරීමට අදාළ ආනයන භාණ්ඩ නිරවුල් කිරීමේ ක්‍රියාවලිය තුළ රේගුව සමඟ කටයුතු කරන ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන එනම් ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යන ආයතනවල ක්‍රියාකාරිත්වය ද අධ්‍යනය කරන ලදී.

### නිරීක්ෂණ

රේගුවේ ප්‍රධාන වගකීම වන්නේ ආදායම එකතු කිරීම, නීති විරෝධී ආනයන හා අපනයන වැලැක්වීම, සාධාරණ වෙළඳාම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ ආනයන හා අපනයන සංඛ්‍යා ලේඛන සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත සැපයීම බව අනු කාරක සභාවේ පළමු නිරීක්ෂණය විය.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රේගුව අත්පත් කොට ගෙන ඇති ප්‍රගතිය වෙත කාරක සභාවේ සැලකිල්ල යොමු විය. වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව විසින් සකස් කොට කළමනාකරණය කරනු ලබන මෘදුකාංගයක් වන "ASYCUDA" නමින් හැඳින්වෙන රේගු දත්ත එක්රැස්කිරීමේ ස්වයංක්‍රීය පද්ධතියේ නවතම සංස්කරණය රේගුව සහ ආයෝජන මණ්ඩලය විසින් මේ වන විට භාවිතා කරන බව වාර්තා විය. එසේම "ASYCUDA" මෘදුකාංගය මේ වන විට රටවල් 80ක පමණ භාවිත කෙරෙන බවත්, ජාත්‍යන්තර වෙළඳාමේ නවතම අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස එය නව තාක්ෂණය යොදා ගනිමින් නිතිපතා දියුණු කරන බවත් වාර්තා විය. ආනයන හා අපනයන වෙළඳාමේ නිරත සියළු පාර්ශ්වකරුවන් සමඟ විද්‍යුත් මාධ්‍යයෙන් සන්නිවේදන කටයුතු කිරීම සඳහා රේගුව විසින් " Single Windows" නැමැති වැඩසටහනක් දැනටමත් ආරම්භ කොට ඇත.

මේ වන විට ශ්‍රී ලංකා රේගුව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, ලංකා මහ බැංකුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය අපනයන යන සංවර්ධන මණ්ඩලය ආදී ආයතන සමඟ ආනයන හා අපනයන තොරතුරු බෙදාහදා ගනියි. එසේම ශ්‍රී ලංකා රේගුව විසින් විද්‍යුත් ගෙවීම් (e – payment), විද්‍යුත් රේගු ලේඛන (e – CUSDOCs) සහ විද්‍යුත් නැව් බඩු ලෙඛන (e – manifests) ලෙස පොදුවේ හැඳින්වෙන විද්‍යුත් සන්නිවේදන පද්ධති රාජ්‍ය බැංකු දෙක, ආනයනකරුවන්, අපනයනකරුවන්, නිශ්කාෂණ නියෝජිතයන්, භාණ්ඩ ප්‍රවාහකයන් හා නාවික නියෝජිතයන් සමග ක්‍රියාත්මක කොට ඇත. තවද, පාර්ශ්වකරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු රේගු වෙබ් අඩවිය මගින්ද සපයයි.

දැනට පවතින විද්‍යුත් ගෙවීම් පද්ධතිය ලංකා බැංකුව සහ මහජන බැංකුව හරහා පමණක් සීමා වී ඇති බවත්, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සී/ස ලංකා ක්ලියර් සමාගම සමඟ එක්ව එය සියළු බැංකු හා සම්බන්ධ කිරීම සඳහා වන නව ව්‍යාපෘතියක් සකස් කරමින් සිටින බවත්, අනුකාරක සභාව නිරීක්ෂණය කරන ලදී. ආනයනකරුවන් සහ අපනයනකරුවන් විසින් විද්‍යුත් රේගු ප්‍රකාශ රේගුව වෙත ලබා දීම සඳහා, නැව් නියෝජිතයින් සහ ඔවුන්ගේ උප නියෝජිතයන් වෙතින් නැව් බඩු ලේඛන ලබා ගැනීම (e – manifests) ක්‍රියාත්මක කොට ඇත.

කෙසේ වෙතත්, භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියේදී රේගුව හා සම්බන්ධ වන අනෙකුත් ව්‍යාවස්ථාපිත ආයතන සතුටුදායක මට්ටමක ප්‍රගතියක් අත් කොට ගෙන නොමැති බවත්, ඒ හේතුවෙන් භාණ්ඩ නිෂ්කාශනයේදී ප්‍රමාදයන් සිදු වන බවත්, අනුකාරක සභාව නිරීක්ෂණය කරන ලදී. මෙහිදී කැපවීම මදකම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රමාණවත් නොවීම උක්ත ක්‍රියාවලිය ඵලදායී ලෙස හැසිරවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය නිසි ලෙස සකස් නොකිරීම පැහැදිලිව නිරීක්ෂණය විය. එසේම ව්‍යාපාර ක්‍රියාවලි නැවත සකස් කිරීම සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය නිසි ලෙස පවත්වාගෙන යාම පිළිබඳව අධ්‍යයනයකින් තොරව තොරතුරු සහ සන්නිවේදන

තාක්ෂණ සම්බන්ධයෙන් කෙරෙන වත්මන් ආයෝජනයන් පිළිබඳව ඉතා විමසිල්ලෙන් සොයා බැලිය යුතු බව අනුකාරක සභාවේ අදහස විය.

රේගුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැඩි දියුණු කිරිම, සාධාරණ වෙළඳාම පහසු කිරීම සඳහා ඇති අවදානම් කළමනාකරණ පද්ධිතය සමඟ පරීක්ෂා කළ යුතු බව අනු කාරක සභාවේ මතය විය. එවන් පහසුකම් සැලසීමේ කටයුතු මින් භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියේදී සිදු වන අනවශ්‍ය මානව මැදිහත්වීම් පිළිබඳ සැලකිල්ල යොමු කළ යුතු අතර පශ්චාත් නිෂ්කාශන පද්ධතියක් සකස් කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය.

රේගුව විසින් දැනට භාවිතා කරනු ලබන අවදානම් කළමනාකරණ පද්ධතිය පිළිගත නොහැකි බව අනු කාරක සභාවේ නිරීක්ෂණය විය. ආනයනය කරනු ලබන සියළු භාණ්ඩ තොග ලේඛන පරීක්ෂාවට සහ භාණ්ඩ පරීක්ෂාවට ලක් කෙරෙන බව අනාවරණය විය. කෙසේ වෙතත්, රේගුව විසින් ලබා දුන් තොරුතුරුවලට අනුව, භාණ්ඩ තොගවලින් 98% ට වැඩි ප්‍රමාණයක් කිසිදු ගැටලුවකින් තොරව රේගුව විසින් නිදහස් කොට ඇත. එබැවින් භාණ්ඩ තොග 100% ක් පරීක්ෂාවට ලක් කිරීම සම්පත් අපතේ යැවීමක් බවත්, එය සාධාරණ වෙළඳාම පහසු කිරීමේ සංකල්පයට පටහැනි බවත් පැහැදිලි විය. එබැවින් පවතින සම්පත් උපරිම ලෙස යොදා ගනිමින් ඵලදායී ලෙස අවදානම් කළමනාකරණය කිරීම පිණිස ආදායම් එකතු කිරීම සහ සීමා කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් වන අවදානම් විශ්ලේෂණය කිරීම සඳහා වඩා ඵලදායී අවදානම් කළමණාකරණ පද්ධතියක් තිබිය යුතු බව අනුකාරක සභාවේ අදහස විය. එබැවින් සිමා කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ ව්‍යවස්ථාපිත අපනයනවල සහයෝගය ඇතිව රේගුව විසින් අවදානම් කළමනාකරණ පද්ධතියක් සකස් කළ යුතුය. දූෂිත නිලධාරීන් සහ දේශපාලන බලපෑම් ඇතුළු සියළු අංශවල අවදානම් රේගුව විසින් විශ්ලේෂණය කොට යෝග්‍ය මානව සම්පත්, “ASYCUDA WORLD” හි වරණීයතා මානකය සහ X - කිරණ යන්ත්‍ර වැනි අනෙකුත් මෙවලම් උපරිම ලෙස භාවිතා කරමින් එම අවදානම් කළමනාකරණය කිරීම අවශ්‍ය කටයුතු කළ යුතුය.

රේගු සහ ආයෝජන මණ්ඩල යෝජනාක්‍රම යටතේ තීරුබදු සහ අයබදු නොගෙවා වරායන් විසින් ඉවත්කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් වන කාන්දුවීම් අවමකිරීම සඳහා ඇපයට බැඳුනු භාණ්ඩ අධීක්ෂණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතා කරගනිමින් ඵලදායී පද්ධති සකස් කළ යුතු බව අනුකාරක සභාව ප්‍රකාශ කරන ලදී.

පොදුවේ ආනයන නිෂ්කාශන සම්බන්ධයෙන් ඇති රේගු ක්‍රියාවලි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සිදු වන වැඩිදියුණුවීම්වලට අනුකූල වන ලෙස නැවත සකස් කළ යුතු අතර, ඒවා හැකි සෑම අවස්ථාවකදීම රේගු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කල යුතුය.

රේගු විමර්ශන සහ පරීක්ෂණ ක්‍රියාවලි සතුටුදායක මට්ටමක නොපවතින බවත්, ඉහළ ප්‍රමුඛතාවයක් මත ඒ පිළිබඳ සොයා බැලිය යුතු බවත්, කාරක සභාවේ නිරීක්ෂණය විය. නීති විරෝධී වෙළඳාම වැලැක්වීම සඳහා රේගුව තුළ විමර්ශන ඒකක කිහිපයක් ඇති නමුත් එම අංශ එකී ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු නොකරන බව පෙනීයයි. ප්‍රමාදයන්ට, ආදායම ගිලිහීයාමට සහ නීතිවිරෝධී වෙළඳාම ආරක්ෂා කරන ආදී දේට මං පාදන දූෂිත සහ වෘත්තීමය නොවන පිළිවෙත් වැලැක්වීම සඳහා මෙම ක්‍රියාවලි නැවත සමාලෝචනයට ලක් කොට වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව අනු කාරක සභාවේ මතය විය.

## නිර්දේශ

1. රේගුවේ "Single Windows" පද්ධතිය ක්‍රියාත්මක කිරීම අවසන් කිරීමට;
2. සාධාරණ වෙළඳාමට අවශ්‍ය පහසුකම් සැලසීමට සහ නීතිවිරෝධී වෙළඳාම වැඩපැවැත්වීම සඳහා රේගුව තුළ ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට; එම පද්ධතිය විසින් දූෂිත නිලධාරීන් සහ දේශපාලන බලපෑම් ඇතුළු සියළු අංශවල අවදානම් විශ්ලේෂණය කොට පවතින මානව සහ අනෙකුත් සම්පත් උපරිම ලෙස භාවිත කරමින් එම අවදානම් කළමනාකරණය කළ යුතුය.
3. "Single Windows" පද්ධතිය සහ අවදානම් කළමනාකරණ පද්ධතිය තුළින් ආනයන සහ අපනයන රේගු ක්‍රියාවලි සමාලෝචනය කිරීම සහ සියළුම පාර්ශ්වකරුවන්ගේ යහපත උදෙසා නව ක්‍රියාවලි රේගු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීමට;
4. රේගුවේ නිවාරණ ප්‍රදේශ ව්‍යුහය සහ විමර්ශන හා පරීක්ෂණ සමාලෝචනය කොට යහපත් නිවාරණ ව්‍යුහයක් සහ යෝග්‍ය විමර්ශන හා පරීක්ෂණ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම හරහා ප්‍රමාදයන්, ආදායම අහිමිවීම සහ නීතිවිරෝධී වෙළඳාම ආරක්ෂා කිරීම ආදියට මං පාදන දූෂිත සහ වෘත්තිමය නොවන පිළිවෙත් පිටුදැකීමට;
5. "Single Windows" පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා අදාල නීතිරීතිවලට අවශ්‍ය සංශෝධන පිළිබඳ සොයා බැලීමට;
6. රේගු සහ ආයෝජන මණ්ඩල යෝජනාක්‍රම යටතේ අවසර දෙන ලද ඇපයට බැඳුනු භාණ්ඩ ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් සකස් කිරීමට;

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබාදීම.

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (දේ.ආ.දෙ)

අගය එකතු කිරීමේ බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආදායම් බදු, හා ආනයනික බදු එකතු කිරීමේ වගකීම පැවරෙන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත බව අනු කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. එසේම ආනයනවලින් අගය එකතු කිරීමේ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු එකතු කිරීමේ වගකීම පැවරෙන්නේ රේගුව වෙතය. ඒ අනුව රජයට ආදායම් ජනනය කොට දෙන දෙවන බදු එකතු කිරීමේ දෙපාර්තමේන්තුව වන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වන අතර, 2015 සංඛ්‍යා ලේඛනවලට අනුව එය රජයේ ආදායමෙන් 30.08%ක් (රේගුව විසින් එකතු කරන ලද ආනයන මත අගය එකතු කිරීමේ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු හැර) එකතු කොට ඇත.

**නිරීක්ෂණ**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු එකතු කිරීමේදී නිසි නාමකරණ පද්ධතියක් සහ රේගුව විසින් අනුගමනය කරනු ලබන ඒකාබද්ධ ක්‍රමය වැනි වර්ගීකරණ ක්‍රමයක් අනුගමනය නොකරන බවත් ,WTO තක්සේරු ක්‍රමය වැනි නිසි තක්සේරු ක්‍රමයක් නොමැති බවත් අනුකාරක සභාව නිරීක්ෂණය කරන ලදී. භාණ්ඩ බදුකරණය සඳහා එවන් ක්‍රමවේදයන් නොමැති වූ විට ආදායම අහිමි වීමට මං පාදන දූෂිත පිළිවෙත හිස ඔසවන බව අනු කාරක සභාවේ අදහස විය. එසේම එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ගේ සංඛ්‍යාව 15696ක් බවත්, මූල්‍ය ආයතන සංඛ්‍යාව 229ක් බවත් වාර්තා විය. මෙම සංඛ්‍යා සැබෑ තත්ත්වය නිරූපණය නොකරන බවත්, රජයට අයවිය යුතු එකතු කළ අගය මත බදු ආදායම අයකර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු බවත්, අනු කාරක සභාව දැන්වීය.

ආදායම් බදු ආදායම පිළිබඳ සැලකිල්ල යොමු කළ අනුකාරක සභාව දැනට ඇති ලිපි ගොනු සංඛ්‍යාව (පෞද්ගලික ආදායම් බදු ලිපි ගොනු 135170, රාජ්‍ය නොවන සංවිධාන 13169, අන්‍යෝන්‍ය අරමුදල් ආදිය) සැබෑ තත්ත්වය නිරූපනය නොකරන බව ප්‍රකාශ කරන ලදී. එබැවින් පෞද්ගලික ආදායම් බදු ලිපි ගොනුවක් විවෘත කළ යුතුද නැත්ද යන්න තහවුරු කර ගැනීම පිණිස රටේ සෑම වැඩිහිටියෙක්ම ප්‍රකාශයක් ලබා ගැනීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු බව අනුකාරක සභාවේ මතය විය. මෙය ක්‍රියාත්මක කිරීමට අපහසු ක්‍රියාවලියක් නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු බෙදා හදා ගත යුතුය. (මෙම දෙපාර්තමේන්තුව තුල මේ වන විට වාහන මිලියන 6ක් පමණ ලියාපදිංචි කොට ඇත.)මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කර ගැනිමේ නීතිමය බාධාවක් නොමැති බව කාරක සභාවට දන්වන ලදී.

ආනයනික බදු සම්බන්ධයෙන්ද දැනට ඇති ආයතනික බදු ලිපි ගොනු සංඛ්‍යාව (47,154)සැබෑ තත්ත්වය නිරූපනය නොකරන බව අනු කාරක සභාවේ මතය වූ අතර, මේ සම්බන්ධයෙන් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු

හුවමාරු කර ගැනීමේ හැකියාව පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සොයා බැලිය යුතුය.

දැනට තිබෙන මානව සම්පත්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහ අනෙකුත් සම්පත් උපරිම පරිදි යොදාගනිමින් ආදායම අහිමිවීම් වලක්වා ගැනීම සඳහා ප්‍රකාශ විගණන ක්‍රියාවලි සහ බදු ලිපි ගොනු හා විමර්ශන ක්‍රියාවලි පිළිබඳ විමසිල්ලෙන් සොයා බැලිය යුතු බව කාරක සභාවේ අදහස විය.

මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිංගප්පූරු රජයේ ආධාර ඇතිව ආදායම් පරිපාලන කළමනාකරණ තොරුතුරු පද්ධති ක්‍රියාවට නැංවීමේ කාර්යයේ නියුතුව සිටින අතර, 2014 වසරේදී ආරම්භ වූ මෙම ව්‍යාපෘතියේ පළමු අදියර 2016 සැප්තැම්බර් මස සම්පූර්ණ කිරීමට නියමිත අතර, දෙවන අදියර 2016 දෙසැම්බර් මස නිමවීමට නියමිතය.

රජයට අයවිය යුතු ආදායම එකතු කිරීම සහ පාර්ශ්වකරුවන් සමඟ ගණුදෙනු කටයුතු සිදු කිරීමේ පහසුව තහවුරු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඵලදායී හා කාර්‍යක්ෂම කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාමේදී අතින් ක්‍රියාත්මක කරනු ලබන පද්ධති සහ ආදායම් පරිපාලන කළමනාරකණ තොරතුරු පද්ධති පරික්ෂා කිරීම සඳහා අභ්‍යන්තර විගණන පද්ධතිය වර්ධනය කිරීමේ වැදගත්කම කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

**නිර්දේශ**

1. රේගුව විසින් ක්‍රියාත්මක කරනු ලබන පද්ධති සැලකිල්ලට ගනිමින් භාණ්ඩ මත අයකරනු ලබන එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැඟීමේ බදු හරහා රජයට අයවිය යුතු ආදායම එකතු කර ගැනිම සඳහා සුදුසු නාමකරණ හා කාණ්ඩකරණ පද්ධතියක් සහ තක්සේරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට; රජයේ අයවිය යුතු එකතු කල අගය මත බදු ආදායම අය කර ගැනීම සඳහා එකතු කළ අගය මත බදු ලියාපදිංචිය ඉහළ දැමීමේ සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම;
2. රජයේ අයවිය යුතු බදු ආදායම අය කර ගැනීම සඳහා නව බදු ලිපි ගොනු විවෘත කිරීමට මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සතු තොරුතුරු ආදී අංශ, තොරතුරු එක්රැස් කිරීමේ ඵලදායි ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට;
3. රජයට අයවිය යුතු ආයතනික බදු ආදායම අයකර ගැනීම සඳහා නව ලිපි ගොනු විවෘත කිරිමට සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සතු තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා තොරුතුරු හා සන්නිවේදන පද්ධති සකස් කිරීමට;

4. රජයට අයවිය යුතු ආදායම එකතු කිරීමේ සහ පාර්ශ්වකරුවන් සමඟ ගනුදෙනු කටයුතු සිදු කිරීම පහසු කිරීම තහවුරු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුල ඵලදායී කළමනාරකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමේ අරමුණ සහිතව ඵලදායී අවදානම් කළමනාරකරණ පද්ධතියක් සහිත ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ වර්ධනයට අනුකූල වන ලෙස අතින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලි නැවත සකස් කිරීම කඩිනමින් ක්‍රියාවට නැංවීමට;

දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට උපදෙස් ලබාදිය යුතුය.

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

2015 දී රජයේ මුළු ආදායමෙන් 7.45%ක් එකතු කරනු ලැබුයේ සුරාබදු දෙපාර්තමේන්තුව බව සැලකිල්ලට ගන්නා ලදී. සුරාබදු ආඥා පනතේ සහ දුම්කොළ බදු පනතේ විධිවිධාන යටතේ ආදායම් එක්රැස් කිරීම සහ නීති විරෝධී ක්‍රියා වැළැක්වීමේ කටයුතු සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව වගකිව යුතු වේ. අබිං සහ අන්තරාකාර ඖෂධ ආඥාපනතේ විධිවිධාන යටතේ නිතිය බලාත්මක කිරීමේ නියෝජිතායතනයක් ලෙස ද දෙපාර්තමේන්තුව කටයුතු කරයි .

### නිරීක්ෂණ

මත්පැන් සහ දුම්කොළ මත නිෂ්පාදන බදු එකතු කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව වගකිය යුතු බව අනුකමිටුව නිරීක්ෂණය කරන ලදී. කෙසේ වෙතත් , මධ්‍යසාරවලින් පමණක් එක්රැස් කර ගන්නා නිෂ්පාදන බදු , දෙපාර්තමේන්තුවේ සමස්ත බදු එකතු කිරීමෙන් 99.7%ක් විය. එබැවින්, මධ්‍යසාර මත ආදායම් රැස්කිරීම සහ එහි සිදුවිය හැකි පිටමංවීම් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ අවදානම් කළමනාකරණය මගින් කළමනාකරණ පද්ධතියේ සිදුකළ හැකි වැඩි දියුණුවීම් කෙරෙහි අවධානය යොමුකිරිමට අනුකමිටුව තීරණය කරන ලදී .

ඒ අනුව, ආදායම පිටමංවීමේ ප්‍රධාන ක්ෂේත්‍රයන් විය හැක්කේ තීරු බදු රහිත සාප්පු, නීති විරෝධී ආනයනය කිරීම් ඇතුළුව රේගු මධ්‍යසාර බැඳුම්කරවලින් සහ දේශිය වශයෙන් නීතිවිරෝධීව එතනෝල් නිෂ්පාදනය කිරීම විය හැකි බව අනුකමිටුව නිරීක්ෂණය කරන ලදී. මධ්‍යසාර පානයන්හි වඩාත්ම සක්‍රීය ද්‍රව්‍යය වන එතනෝල් වෙනත් කාර්යයන් සඳහා කර්මාන්තයන්හි යොදා ගැනේ. ඇතැම්විට පානීය භාවිතය සඳහා යෝග්‍ය නොවන මෙම එතනෝල්, නීතිවිරෝධී මත්පැන් නිපදවීම සඳහා අනිසි ලෙස යොදා ගනු ලැබේ. නීතිවිරෝධී මත්පැන් නිපදවීම සඳහා සීනි ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් දේශියව ද එතනෝල් නිෂ්පාදනය කරනු ලැබේ. මෙම නීති විරෝධී මත්පැන් නිසා රජයට ආදායම අහිමි වන අතර සෞඛ්‍ය ගැටලු ඇති කරයි.

නීතිවිරෝධී මත්පැන් නිෂ්පාදනය මැඩලීම සඳහා විධිමත් අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර නොමැති බව අනුකමිටුව නිරීක්ෂණය කරන ලදි .

තීරු බදු රහිත සාප්පු ඇතුළුව, රේගු මධ්‍යසාර බැඳුම්කරවලින් පිටමංවීම්වලට අදාළව සුරාබදු දෙපාර්තමේන්තුව, රේගුව සමග ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාවට නංවා ඵලදායී අවදානම් කළමනාකරණ වැඩසටහනක් ස්ථාපිත කළ යුතු බව අනුකමිටුවේ අදහස විය . අවදානම් ක්ෂෙත්‍ර හඳුනාගැනීම සඳහා සහ සඵල අවදානම් කළමනාකරණ පද්ධතියක් මගින් අවදානම් කළමනාකරණය කිරීම පිණිස පළමුව පසුගිය වසර පහ තුළ රේගුව විසින් සිදු කළ සොයා ගැනීම් අධ්‍යයනය කළ යුතුය.

නීති විරෝධී මත්පැන් නිපදවීම සඳහා එතනෝල් ආනයනය කිරීමට අදාළව, අනුකමිටුවේ මතය වූයේ, අවදානම් ක්ෂෙත්‍ර හඳුනාගැනීම සහ සඵල අවදානම්

කළමනාකරණ පද්ධතියක් මගින් අවදානම් කළමනාකරණය කිරීම පිණිස, පසුගිය වසර පහ තුළ රේගුව විසින් සිදු කළ සොයා ගැනීම් මත ලබාගත් තොරතුරු යොදා ගනිමින් සුරාබදු දෙපාර්තමේන්තුව විස්තරාත්මක අධ්‍යයනයක් සිදුකළ යුතු බවයි .

නීති විරෝධී මත්පැන් සඳහා දේශිය වශයෙන් නීති විරෝධීව එතනෝල් නිෂ්පාදනය කිරීමට අදාළව, අනුකමිටුවේ අදහස වූයේ පළමුව නීතිවිරෝධී මත්පැන්වල අමුද්‍රව්‍ය මූලාශ්‍ර සහ නිෂ්පාදන ක්‍රියාවලිය අවබෝධ කර ගැනීමට සහ එමඟින් අවදානම් ක්ෂෙත්‍ර හඳුනාගැනීම සහ සඵල අවදානම් කළමනාකරණ පද්ධතියක් මඟින් අවදානම් කළමනාකරණය කිරීම පිණිස අදාළ සියලු නියෝජිතායනවල සහභාගිත්වයෙන් සුපරීක්ෂාකාරී අධ්‍යයනයක් සිදුකළ යුතු බවයි.

නීතිවිරෝධී ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරිම පිණිස සුරාබදු දෙපාර්තමේන්තුව යම් පියවර ගෙන ඇති නමුත් නීතිවිරෝධී වෙළඳාම අධෛර්යමත් කරන අතරම අවශ්‍ය ආදායම් එකතු කිරීම පිණිස ඔවුන් සිය බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කළ යුතු බව කමිටුවේ අදහය විය. උදාහරණයක් ලෙස, බදු වැඩිකිරීම සහ කර්මාන්තයන්හි නීත්‍යානුකූල භාවිතය සඳහා ආනයනය කරන එතනෝල් කෝටාව අඩුකිරීම වැනි ඇතැම් මුලාරම්භයන්, අවශ්‍ය ආදායම රැස්කිරීම සහ නීතිවිරෝධී වෙළඳාම අධෛර්යමත් කිරීම සඳහා විසඳුම නොවිය හැකි බව අනුකමිටුවේ මතය විය.

තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අදාළව, අනුකමිටුව වෙත දැනුම් දෙනු ලැබුයේ, සුරාබදු ආදායම වඩා හොඳින් කළමනාකරණය කිරීමේ අරමුණ ඇතිව පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කරන බවයි.

**නිර්දේශ**

## සුරාබදු අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට:

1. නිත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සැපයීමටත් නීති විරෝධී වෙළඳාම මැඩලීමටත් අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම - එම පද්ධතිය, දූෂිත නිලධාරින් සහ දේශපාලන මැදිහත්වීම් ඇතුළුව අවදානම්වල සියලු අංශ විශ්ලේෂණය කර පවතින මානව සහ අනෙකුත් සම්පත් සමඟින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය ප්‍රශස්තව භාවිතා කිරීම මඟින් එම අවදානම් කළමනාකරණය කිරීම.

2. මධ්‍යසාර පිළිබඳ වත්මන් බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ නීති විරෝධී වෙළඳාම අධෛර්යමත් කරමින් සහ නිත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සපයමින් අවශ්‍ය බදු එකතු කිරීම පිණිස යෝග්‍ය බදු ප්‍රතිපත්තියක් මුදල් අමාත්‍යාංශයට නිර්දේශ කිරීම.

3. අවශ්‍ය දත්ත සමුදායක් ගොඩනැඟීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විමසා යෝග්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතියක්

ස්ථාපිත කිරීම සහ දෙපාර්තමේන්තුවේ අරමුණු වඩා කාර්යක්ෂමව සහ ඵලදායීව සාක්ෂාත් කර ගැනිම පිණිස අදාළ දත්ත සියලු පාර්ශ්වකරුවන් වෙත සන්නිවේදනය කිරීම සහ ඔවුන් සමඟ බෙදා හදා ගැනීම.

4. එතනෝල් නීති විරෝධීව ආනයනය කිරීම්, එතනෝල් නීති විරෝධීව නිෂ්පාදනය කිරීම සහ නීති විරෝධීව මත්පැන් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා පොලීසිය පසුගිය වසර පහ තුළ (2012 - 2016) සිදුකළ සොයා ගැනීම් පිළිබඳව විස්තරාත්මක අධ්‍යයනයන් සිදු කිරිම සහ හඳුනාගත් අවදානම් ක්ෂෙත්‍ර සහ ආදායම් අහිමිවීම සහ සෞඛ්‍ය ගැටළු යන දෙකටම අදාළව අවදානම් කළමනාකරණය කිරීම සඳහා ගනු ලැබූ පසු විපරම් ක්‍රියා මාර්ග පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම

සඳහා උපදෙස් දෙන ලදී .

## අනෙකුත් නිරීක්ෂණ

කාරක සභාව හමුවට කැඳවනු ලැබූ අනෙකුත් ආයතන විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරිම සහ ආදායම් අපනයන ප්‍රධාන නියෝජිතායතනවල තොරතුරු සන්නිවේදන තාක්ෂණප ද්ධති සමඟ එම වැඩසටහන්වල අන්තර් සැබැඳුම් හා අදාළව පහත දැක්වෙන තත්ත්වයන් අනුකමිටුව නිරීක්ෂණය කරන ලදී.

මෝටර් රථ වාහන පිළිබඳ ආනයන දත්ත රේගුව, මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව සමඟ බෙදා හදා ගත්ත ද, ලියා පදිංචි කරන ලද වාහන පිළිබඳ තොරතුරු රේගුව සමග හෝ නීතිය බලාත්මක කිරීමේ අනෙකුත් ආයතන සමග බෙදාහදා ගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණි. ලියාපදිංචි නොකළ නීති විරෝධී වාහන මාර්ගවල ධාවනය කරන්නේය යන කරුණ සැලකිල්ලට ගනිමින්, වාහන නීති විරෝධීව විකිණීම මැඩලීම පිණිස එම තොරතුරු රේගුව සහ ශ්‍රී ලංකා පොලිසිය සමඟ බෙදා හදා ගැනිම සඳහා මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණික පද්ධතිය වැඩි දියුණු කළ යුතු බව අනු කමිටුවේ අදහස විය. එසේම, නව බදු ලිපිගොනු ආරම්භ කිරිමට ඔවුනට හැකිවන පරිදි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ද මෙම තොරතුරු, පාදක තොරතුරු ලෙස මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව සමඟ බෙදා හදා ගත යුතුය. මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම, මෝටර් රථ වාහන පැවරීම සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව දැනට තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදාගන්නා බව අනුකමිටුව නිරීක්ෂණය කරන ලදි. දිස්ත්‍රික් කාර්යාල 17 ම ආවරණය කරමින් අවම මිනිස් මැදිහත්වීමකින් වෙබ් පාදක ලියාපදිංචි කිරීමේ පද්ධතියක් මත ක්‍රියාත්මක කිරීම අපේක්ෂාවෙන් විද්‍යුත් අධීක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම පිණිස සැලැස්මක් මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව සතු බව ද තවදුරටත් වාර්තා කරන ලදි.

සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වත්මනෙහි තොරතුරු තාක්ෂණය භාවිතය ඉතා අවම මට්ටමක පවතින බව සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ විසඳුම්

සැපයීම ක්‍රියාත්මක කිරීම, ආයතනික කාර්යක්ෂමතාව ඉහළ නංවමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට වැදගත් තොරතුරු සැපයීම පහසු කරනු ඇති බව අනුකමිටුවේ අවධානයට යොමු විය. දෙපාර්තමේන්තුව සඳහා විස්තීරණ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීම ඉතා ඉක්මනින් අවසන් කරන බවත් සහ 2017අප්‍රේල් 30දින වන විට එය පූර්ණව ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන බවත් වාර්තා කරන ලදී.

ඇතැම් නෛතික බාධක නිසා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ජාතික විද්‍යුත් හැඳුනුම් පත් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම ප්‍රමාද වී ඇති බව සහ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමෙන් පසුව එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට නියමිත බව කමිටුව නිරීක්ෂණය කරන ලදී. මාස නවයක කාල සීමාවක් තුළ ජාතික විද්‍යුත් හැඳුනුම් පත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. පනතේ විධිවිධාන තුළ ඇතැම් තොරතුරු අනෙකුත් බාහිර ආයතන සමග බෙදා හදා ගැනීමට හැකි බව වාර්තා කරන ලද අතර වත්මනෙහි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ජාතික හැඳුනුම්පතේ තථ්‍යභාවය තහවුරු කර ගැනීමට හැක.

රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, අපනයන ආනයන පාලන දෙපාර්තමේන්තුව සහ කොළඹ මහ නගර සභාව තමන්ගේම තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ නිරතව සිටින අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිරෝධායන අංශය යන නියෝජිතායතන සඳහා රේගු භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාදාමය සඳහා නිර්දේශ විද්‍යුත් මාර්ගයෙන් ලබාගැනීමට රේගුව විසින් පහසුකම් සපයා ඇති බව කමිටුව නිරීක්ෂණය කරන ලදි .

නෞභාර පරීක්ෂාව, සාම්පල විශ්ලේෂණය, ගාස්තු අය කිරීම වැනි අතිච්ඡාදනය වන ක්ෂේත්‍ර පවතින බවත් අදාළ බලධාරීන් අතර සඵල සහයෝගීතාව තුළින් ඒවා සමාලෝචනය කර සරල කිරීමට හැකි බවත් අනුකමිටුව නිරීක්ෂණය කරන ලදී. උදාහරණයක් ලෙස, තම සේවා සඳහා අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන ගෙවීම් එකතු කිරීම, ඊ-ගෙවුම් පද්ධතිය හරහා අනෙකුත් බදු සහ ගෙවීම් සමග එවැනි ගෙවීම් අයකර ගන්නා ලෙස රේගුවෙන් ඉල්ලා සිටීම මගින් සරල කරගැනීමේ හැකියාව ඇත.

තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදාගැනීම සමඟින් විද්‍යුත් අත්සන් වැනි අදාළ අණ පනත් සඳහා සිදුකළ යුතු සංශෝධන ද සොයා බලා හැකි ඉක්මණින් ක්‍රියාවට නැංවිය යුතු බව ද අනුකමිටුව නිරීක්ෂණය කරන ලදී.

මාර්ගගත ගෙවීම් පහසුකම (e-payment) සම්බන්ධයෙන් අනුකමිටුව නිරීක්ෂණය කරන ලද්දේ වත්මන් සැකසුම රාජ්‍ය බැංකු දෙකක් සමග කටයුතු කිරීමට පමණක් සීමා කරනු ලැබ ඇති බවයි. ඒ අනුව, අනෙකුත් බැංකුවල ගිණුම් ඇති ගනුදෙනුකරුවන්ට වෙනත් බැංකු විසින් නිකුත් කරන ලද ගෙවුම් නියෝග හෝ මුදලින් ඔවුන්ගේ ගෙවීම් කිරීමට සිදුව තිබේ. අනෙකුත් බැංකු හරහා ද මාර්ගගත ගෙවීම් සඳහා පහසුකම් සැපයීමට

මහ බැංකුව, තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ලංකා ක්ලියර් සමාගම සහ මුදල් අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක එක් වැඩසටහනක් තිබුණ ද, අරමුදල් පැවරුම සඳහා තීරක වේලාවක්, එක් අරමුදල් පැවරුමක් සඳහා උපරිම සීමාවක්, අරමුදල් පැවරුම සඳහා පිරිවැයක් ආදිය වැනි සීමාකිරීම් හේතුවෙන් මේ සම්බන්ධයෙන් අවසන් තිරණයකට එළඹීමට නොහැකිව ඇත. එකතු කළ මුදල් ක්ෂණිකව සහ සකසුරුවම් ආකාරයෙන් භාවිතා කිරීම සඳහා, ආදායම් උපදවන ප්‍රධාන දෙපාර්තමේන්තුවලට බැංකු ගිණුම් විවෘත කිරීමට සහ එම බැංකු සමග මහා භාණ්ඩාගාරයේ අන්‍යොන්‍යාධාර ගිණුම් විවෘත කිරීමට ඉඩ දීම මගින් පමණක් වුවද, රාජ්‍ය බැංකු දෙක සඳහා යොදාගත් ක්‍රමය තෝරාගත් පුද්ගලික බැංකු සඳහා ද ව්‍යාප්ත කළ හැකි බව අනුකමිටුව නිරීක්ෂණය කරන ලදී.

## පොදු නිර්දේශ

## මුදල් අමාත්‍යාංශයට උපදෙස්

1. ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සහභාගිත්වයෙන් සහ අනෙකුත් අවශ්‍ය නියෝජන සහිතව පහත සදහන් දෑ සපුරා ගැනීම සඳහා නිශ්චිත කාල වකවානු සහිත ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මක කිරීම පිණිස කැපවූ කණ්ඩායමක් ස්ථාපිත කර නායකත්වය දීම.

    1.1. රේගු අධ්‍යක්ෂ ජෙනරාල්, දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් සහ සුරාබදු කොමසාරිස් ජෙනරාල් හට මේ වාර්තාවෙන් ලබා දී ඇති මගපෙන්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් සපයා අධීක්ෂණය කිරීම.

    1.2. වැඩසටහන් කාලීනව ක්‍රියාත්මක කිරීම සහ ආදායම් පිටමංවීම් වළක්වාලීම සඳහා බදු පදනම පුළුල් කිරීම පිණිස තොරතුරු බෙදා හදා ගැනීමට මෝටර් රථවාහන කොමසාරිස් ජෙනරාල්, සමාගම් රෙජිස්ට්‍රාර්, පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් යෝජිත තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩසටහන් අධීක්ෂණය කර මග පෙන්වීම.

    1.3. සඵල අවදානම් කළමනාකරණ පද්ධතියක් හරහා නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සපයමින් නිසි ආනයන පාලන සහතික කිරීම සඳහා ආනයන නිෂ්කාශන ක්‍රියාවලියේදී රේගුව සමග සම්බන්ධ වන ප්‍රධාන ආයතන වන ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය (ආහාර පාලනය සඳහා), සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (සත්ව නිරෝධායනය සඳහා) සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ශාක නිරෝධායනය සඳහා) යෝජිත තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධති අධීක්ෂණය කර මග පෙන්වීම. අතිච්ඡාදන ක්ෂේත්‍ර අවම කිරීම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය හරහා ක්‍රියාවලි සරල කිරීම පිණිස තොරතුරු තාක්ෂණ යෙදුම් භාවිතයට පෙර ප්‍රති සැලසුම් ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

    1.4. ප්‍රධාන ආදායම් උපයන දෙපාර්තමේන්තු තුන විසින් දැනට භාවිතා කරනු ලබන මෘදුකාංග වැඩසටහන් පිළිබඳ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් පද්ධති විගණනයක් සිදු කිරීම සහ මාස හයක් ඇතුළත විගණකාධිපතිවරයාට වාර්තා කිරීම.

2. බදු ගෙවන්නන්ට තම බදු ගෙවීම් පහසු කරලීම පිණිස සහ දින 24x7 පුරාම ටෙලිබැන්කිං වැනි බැංකුකරණයේ නවතම වර්ධනයන් ක්‍රියාත්මක කිරීම දිරි ගැන්වීම පිණිස වත්මනෙහි රාජ්‍ය බැංකු දෙකක් සමග ක්‍රියාත්මක කරන ඊ-ගෙවීම්

පහසුකම තෝරාගත් පෞද්ගලික බැංකු කිහිපයක් සඳහා ව්‍යාප්ත කිරීමේ හැකියාව සොයා බැලීම.

3. ප්‍රගතිය අධීක්ෂණය කිරීම පිණිස කාර්තු පදනමින් ප්‍රගති වාර්තා රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඉදිරිපත් කිරීම. එක් එක් ක්‍රියාකාරකම සඳහා කාල වකවානු සහිත විස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් පළමු වාර්තාව සමග ඉදිරිපත් කළ යුතුය.

4. අවශ්‍ය නම්, තාක්ෂණික දැනුමැති දේශීය හෝ විදේශීය විශේෂඥයන්ගේ සහාය ලබා ගැනීමෙන් පසු, මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් 2017 ඔක්තෝබර් 1 වන දින වන විට විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ යුතුය.

1. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (සභාපති)
2. ගරු බන්දුල ගුණවර්ධන මහතා
3. ගරු සෙයිඩ් අලි සහීර් මවුලානා මහතා
4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
5. ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

**ඇමුණුම 'බී-1'**

## කමිටුව සාකච්ඡා කළ කරුණු

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### වර්තමාන තත්ත්වය

- මාර්ගගත (online) ගනුදෙනු කිරීමේ පහසුකම දැනට ඇත.
- සියළු බදු වර්ග ස්වයංක්‍රීයකරණය යොදවා ඇත.
- අක්‍රමිකතා වැළැක්වීම පිණිස කලින් මුද්‍රණය කරන ලද බදු ගෙවීමේ පත්‍රිකා
- අතුරු මුහුණත් කිරීම හෝ සම්බන්ධ කිරීම සඳහා ආයතන 23ක් හඳුනාගෙන ඇත. රේගු දෙපාර්තමේන්තුව, ලංකා බැංකුව, මහජන බැංකුව, මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය සමඟ එකිනෙක සම්බන්ධ කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

### බාධක

- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සමඟ ජාල පහසුකම නොමැති වීම හේතුවෙන් එම දෙපාර්තමේන්තුව සමඟ අතුරු මුහුණත් කිරීමට නොහැකි වීම.
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට නෛතික බාධාවන් හේතුවෙන් අවශ්‍ය තොරතුරු ලබා දීමට නොහැකි වීම.
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට නෛතික බාධාවන් හේතුවෙන් අවශ්‍ය තොරතුරු ලබා දීමට නොහැකි වීම.
- ඇතැම් ප්‍රාදේශීය කාර්යාල වලට අළුත් පරිගණක ලබා දී නොතිබීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රාදේශීය කාර්යාල 2 වැනි අදියරට සමෝධානය කිරීමට නොහැකි වීම.
- අනෙකුත් ආයතන වෙතින් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවීම.
- බදු ගෙවන්නන් හා අභ්‍යන්තර කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සඳහා සම්පත් නොමැති වීම.
- අතිරේක මිනිස් බල අවශ්‍යතා

### ශක්තීන්

- ආයතන 23 අතුරු මුහුණත් කිරීමෙන් හෝ එකිනෙක සම්බන්ධ කිරීමෙන් පසු බදු ගෙවන්නන්ට අනන්‍ය අංකයක් ලබා දීමේ හැකියාව
- සබැඳිය භාවිතා කරමින් යම් තැතැත්තෙකුට බදු ලිපි ගොනුවක් තිබේද නැතිද යන්න සොයා බැලීමේ හැකියාව

- පද්ධති විගණනය

## කාරක සභාව විසින් කරන ලද යෝජනා

- ණය කාඩ් පත් භාවිතා කරමින්ද බදු ගෙවීමේ ක්‍රමය හඳුන්වාදීම.
- RAMIS පද්ධතිය පිළිබඳව විගණනයක් සිදු කර ඒ සම්බන්ධයෙන් සිය අදහස් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට විගණකාධිපතිවරයාට හැකි වනු පිණිස අදාල ලිපිලේඛන විගණකාධිපතිවරයා වෙත ලබා දීම.
- පද්ධතිය බදු ගෙවන්නන් වෙනුවෙන් හිතකාමී හා පහසු තත්ත්වයට පත් කිරීම.
- පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ හෝ යම් ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පවතින බාධක කාරක සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කිරීම.
- ආදායම එකතු කිරීම සහ එසේ එකතු කරන ලද අරමුදල් ලංකා බැංකුව වෙත හෝ වෙනත් බැංකුවක් වෙත මාරු කිරීම පිළිබඳව ලංකා බැංකුව හා වෙනත් බැංකු සමඟ සාකච්ඡා කිරීමේ හැකියාව විමසා බැලීම.
- මහජනතාවට දේශීය ආදායම් දෙපාර්තමේන්තු පද්ධතිය කරා පහසු ප්‍රවේශය හා ඇපයකින් තොරව ලියාපදිංචි වීමට පහසුකම් සැලැස්වීම හා ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය පහසු කිරීම.
- බැංකු, ණය කාඩ් පත්, වාහන ලියාපදිංචි කිරීම ආදී භාවිතය/ගනුදෙනු අධීක්ෂණය කිරීම මඟින් ආදායම වැඩි කර ගැනීමේ හැකියාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විමසා බැලීම
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව දත්ත හවුලේ භාවිතා කිරීම හා සබැඳි පෞද්ගලිකත්ව රෙගුලාසි හඳුනා ගැනීම සඳහා වර්තමාන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යළි සමාලෝචනය කර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මත යැපෙන ප්‍රධාන රජයේ ආයතන අතර වර්තමාන හා අනාගත දත්ත හවුලේ භාවිතා කිරීමේ අවශ්‍යතා අනුව අවශ්‍ය සංශෝධන සිදු කළ යුතුය.

## රේගු දෙපාර්තමේන්තුව

### වර්තමාන තත්ත්වය

- අපනයන කරුවන් වැඩි දෙනෙකුට විද්‍යුත් පද්ධතිය කරා ප්‍රවේශය
- රේගු ගාස්තු ගෙවීම සඳහා ගනුදෙනු කරුවන්ට පූර්ණ විද්‍යුත් පහසුකම

### බාධක

- අංගන වල පරීක්ෂණ ඒකක ස්වයංක්‍රීය පද්ධතියට සම්බන්ධ කර නොමැත. දුරින් පිහිටි අංගන වෙත ජාල සම්බන්ධතාව නැත.
- බාහිර නියෝජිත ආයතන වල, උදා. බැංකු, නැව් නියෝජිත ආයතන ආදියෙහි ස්වයංක්‍රීයකරණය නොමැත.
- සංඛ්‍යාංක (ඩිජිටල්) අත්සන් ලේඛන/ ලදුපත් ආදිය නිකුත් කිරීමේ බලයක් නොමැත.

### කාරක සභාව විසින් කරන ලද යෝජනා

- දැනට පවතින ගෙවීමේ ක්‍රමය පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය වෙනස් කර එබඳු රේගු ගාස්තු ගෙවීම් ණය කාඩ්පත් හරහා සිදු කිරීම ඇතුළත් කිරීම.
- ගුවන් බඩුතොග පද්ධතිය වහාම ක්‍රියාත්මක කිරීම.
- ඉලෙක්ට්‍රොනික ගනුදෙනු ශක්තිමත් කිරීමට සහ ඉලෙක්ට්‍රොනික ක්‍රමයෙන් හුවමාරු කෙරෙන ලේඛන නෛතික වශයෙන් වලංගු ලේඛන ලෙස පිළිගැනීම පිණිස ජාතික සහතික කිරීමේ අධිකාරිය පිහිටුවීමේ ක්‍රියාවලිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් කඩිනම් කරනු ලැබීම සහ එමඟින් රේගුදෙපාර්තමේන්තුවට සංඛ්‍යාංක (ඩිජිටල්) අත්සන් ලේඛන/ ලදුපත් ආදිය නිකුත් කිරීමේ අවසරය ලබා දීම. ( 2006 ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත බලන්න )
- ජාතික මට්ටමේ ගෙවුම් වේදිකාව නියමානුකූල කිරීම.
- කාර්යක්ෂම මුල් පිටු වර්ගීකරණ ක්‍රමයක් සහ නිවැරදි ආදායම ලබා ගැනීම සඳහා තක්සේරු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ තොරතුරු පද්ධති වල වැදගත් කම
- ස්වයංක්‍රීයකරණ පද්ධතිය සහ අවදානම් කළමණාකරණ පද්ධතිය සමගාමීව දියුණු කිරීම.

# සුරාබදු දෙපාර්තමේන්තුව

## වර්තමාන තත්ත්වය

- මෘදුකාංගය හරහා දේශීයව නිෂ්පාදනය කෙරෙන මත්පැන් පිළිබඳ දත්ත දෛනිකව ප්‍රධාන කාර්යාලයට මාරු කිරීමේ හැකියාව

## අනාගත විකාශන

- මත්පැන් බලපත්‍ර වලින් ආදායම ලබා ගැනීම පිණිස EOI ලේඛන පිළිබඳ මෘදුකාංග සකස් කිරීම.
- මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම පිණිස ඉලෙක්ට්‍රොනික සේවා ක්‍රියාත්මක කිරීම.
- අමුද්‍රව්‍ය වල සිට අවසාන නිෂ්පාදනය දක්වා නිෂ්පාදන අධීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- අව්‍යාජ නිෂ්පාදන හඳුනාගෙන ආදායම සුරක්ෂිත කරගැනීමට පහසුකම් සැලසීම පිණිස මත්පැන් බෝතල් මත ඇලවීම සඳහා විශේෂ ස්ටිකරයක් හඳුන්වාදීම.
- ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති සැලසුම් කිරීමේ පද්ධතිය ( BPRS) භාවිතා කිරීම - පේළි ක්‍රියාවලි වඩාත් හොඳ තත්ත්වයට ගෙන ඒමට හා අගය එකතු නොකෙරෙන කාර්යයන් ස්වයංක්‍රීය කිරීමට, ව්‍යාපාර අතර කාර්ය ගලායාම විශ්ලේෂණය කිරීම හා ප්‍රති සැලසුම් කිරීම සඳහා කළමනාකරණ මෙවලමක් ලෙස

## කාරක සභාව විසින් කරන ලද යෝජනා

- එතනෝල් ආනයනයන් අධික්ෂණය කිරීම පිණිස රේගු දෙපාර්තමේන්තුව සමඟ දැඩි සබඳතාවක් පවත්වා ගැනීම.
- ආනයන සහ අපනයන ක්‍රියාවලියට සම්බන්ධව සිටින සෑම ආයතනයක්ම සතුව ඔවුන්ගේම අවදානම් කළමනාකරණ පද්ධතියක් පැවතීම.
- වියදම් අධික වුවත් විගණකාධිපතිවරයා හරහා ස්වයංක්‍රීය කරන ලද පද්ධතිය පිළිබඳ විගණනයක් සිදු කිරීම
- පද්ධතිය නඩත්තු කිරීම පිණිස වගකිව යුතු තැනැත්තෙකු පත් කිරීම.

මෙම අවස්ථාවේදී කාරක සභාව වරකට ප්‍රධාන ආදායම් උපයන සංවිධාන එකක් කේන්ද්‍ර කර ගනිමින්, ඒවායේ ආදායම් රැස් කිරීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේදී සහායක විය හැකි හෝ අවශ්‍ය විය හැකි තවත් ආයතන කිහිපයක් සමඟ අන්තර් ක්‍රියාකාරී සැසි කිහිපයක් පැවැත්වීමට තීරණය කළේය.

ඒ අනුව, පහත සඳහන් සංවිධාන කාරක සභාව ඉදිරියට කැඳවා පහත දක්වා ඇති ක්ෂේත්‍ර කෙරෙහි අවධානය කේන්ද්‍රගත කරමින් ඒවා පරීක්ෂා කරන ලදී.

- විගණන කළමනාකරණ පද්ධතිවල සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධති වල වර්තමාන තත්ත්වය
- විගණන කළමනාකරණ පද්ධතිය සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධතිය යටතේ මුහුණ දෙනු ලබන වර්තමාන ගැටළු සහ බාධක
- වර්තමාන විගණන කළමනාකරණ පද්ධතිවල සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධති වල ශක්තීන් සහ දුබලතා
- අනාගත වැඩිදියුණු කිරීම් වෙනුවෙන් සැලසුම්
- විගණන කළමනාකරණ පද්ධතිය සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධතිය යටතේ බාහිර ආයතන සමඟ සම්බන්ධ වීමේ ගැටළු
- ආදායම සැසඳුම

## සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

පහත සඳහන් කරුණු සාකච්ඡා/ හෙළිදරව් කරන ලදී.

- දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ පද්ධතියම පරිගණකගත කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබ ඇති අතර කොන්ත්‍රාත්තුව පිරිනැමීම නුදුරේදීම සිදු වනු ඇත.
- පද්ධතිය සකස් කිරීම සඳහා මාස 06 ක කාලයක් ලබා දෙනු ඇත. (2017/01/31 දිනට හෝ ඊට පෙර අවසන් කිරීමට)
- සම්පූර්ණ ක්‍රියාවලියම 2017/04/30 වන විට අවසන් කෙරෙනු ඇත.
- 2017/02/01 න් පසු, නව සමාගමක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පැය 24 ක් තුළ අවසන් කිරීමේ හැකියාව ලැබෙනු ඇත.
- නව ලියාපදිංචියෙහි බඳු ගෙවන්නන් පිළිබඳ විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට හැකි වනු ඇත.
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ තෝරා ගත් වෙනත් ආයතන සමඟ අන්තර් සබඳතාව පවත්වා ගැනීමට හැකි වනු ඇත.

ආයතනික අවශ්‍යතා පිළිබඳ තොරතුරු හුවමාරු කරගනිමින් ඒ අනුව පද්ධති දෙක අතර සම්බන්ධතාව වැඩිදියුණු කරගන්නා ලෙස කාරක සභාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයාට උපදෙස් දෙන ලදී.

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

- ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය 2011 දී ආරම්භ කරන ලද නමුත් නෛතික බාධා හේතුවෙන් එය තාවකාලිකව අත්හිටුවන ලදී.
- අදාල පනතට සංශෝධන 2016 ජූනි මස 21 වැනි දින සම්මත කරන ලද අතර ව්‍යාපෘතිය 2016 අගෝස්තු මසදී යලි ආරම්භ කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 ම දෙපාර්තමේන්තුවේ ස්වයංක්‍රීයකරණය කරන ලද පද්ධතියට සම්බන්ධ කිරීමට නියමිතය.
- දැනට පවතින නෛතික රාමුව තුළ, අවබෝධතා වැඩපිළිවෙළවල් හරහා බාහිර නියෝජිත ආයතන අතර දත්ත හුවමාරු කරගැනීම නීත්‍යානුකූල වේ.
- පද්ධති වැඩිදියුණු කිරීම් අවසන් වූ පසු, සති දෙකක කාලසීමාවක් තුළ නව ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට හැකි වනු ඇත.
- මාස 09 ක් තුළ, පැරණි ජාතික හැඳුනුම්පත් වෙනුවට ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට හැකි වනු ඇත.
- අන්තර්කාල විසඳුමක් ලෙස, සංක්‍රාන්ති කාල පරිච්ඡේදය තුළ අයදුම් කරුවන්ට නව හැඳුනුම්පත් නිකුත් කෙරෙනු ඇත.
- 2017 දීඅ.පො.ස. (සා.පෙ. ) අයදුම්කරුවන්ට නව ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් නිකුත් කෙරෙනු ඇත.
- මෘදුකාංග සකස්කිරීමේ මූලාශ්‍ර කේත වල හිමිකම දෙපාර්තමේන්තුව දරණ හෙයින්, යම් තාක්ෂණික නියෝජිත ආයතනයක උපකාරය ඇතිව දෙපාර්තමේන්තුව විසින්ම පද්ධතිය වැඩිදියුණු කිරීම් හා යාවත්කාලීන කිරීම් සිදු කළ හැකිය.
- දැනට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පුද්ගලයෙකුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමේ හැකියාව ඇත. RAMIS පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ සාමාන්‍ය දත්තද හවුලේ භාවිතා කළ හැකි වනු ඇත.

ඩිජිටල් ගනුදෙනු කාඩ්පත සහ ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත ඒකාබද්ධ කිරීම සඳහා 2017ජූනි මස 30වැනිදාට පෙර කටයුතු සලස්වන මෙන් ගරු අග්‍රාමාත්‍යතුමා උපදෙස් දී ඇති බව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරි/ කළමනාකරණ අධ්‍යක්ෂ සඳහන් කළේය.

එම අරමුණ ඉටු කරගැනීම සඳහා, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට දැනට ප්‍රමාණවත් නෛතික ප්‍රතිපාදන නොමැති බවත් අදාල ආයතන වල දැනට පවතින පනත් ඒ අනුව සංශෝධනය කළ යුතු බවත් කොමසාරිස් ජනරාල් වරයා පෙන්වා දුන්නේය.

නෛතික ක්‍රියාවලිය දීර්ඝ හා සංකීර්ණ වන බැවින් 2017 ජුනි 30 වැනි දිනට පෙර කාඩ්පත දියත් කිරීමේ ප්‍රායෝගික බව පිළිබඳව සභාපතිවරයා විමසුවේය.

මෙම කරුණ නීතිපතිවරයා වෙත යොමු කර ඔහුගේ උපදෙස් ලබාගන්නා ලෙස කාරක සභාව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වරයාට සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරි/ කළමනාකරණ අධ්‍යක්ෂවරයාට උපදෙස් දුන්නේය.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් රැස් කර ගනු ලබන පෞද්ගලික දත්ත වෙනත් ආයතන සමඟ හවුලේ භාවිතා කරන විට එම පුද්ගලයාගේ රහස්‍ය භාවය නිසැකවම ආරක්ෂා කළ යුතු බව කාරක සභාවේ මතය වූ අතර මෙම කරුණ කෙරෙහි බරපතල අවධානය යොමු කරන ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරි/ කළමනාකරණ අධ්‍යක්ෂවරයාට උපදෙස් දෙන ලදී.

අධිකරණ නියෝගයක් මත හෝ අදාල පුද්ගලයාගේ කැමැත්ත ඇතිව පමණක් මෙම ආකාරයේ දත්ත හවුලේ භාවිතා කළ හැකි බව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වරයා සඳහන් කළේය. පුරවැසි දත්ත කළමනාකරණ කමිටුවක් පිහිටුවනු ලැබ ඇති බවත්, එබඳු අවශ්‍යතා විධිමත් කර යම් නිශ්චිත පනතක විධිවිධාන ලෙස ඉදිරිපත් කරනු ලැබිය යුතු බවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරි/ කළමනාකරණ අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

පද්ධති විගණනයක් සිදු කරන ලෙස කාරක සභාව විගණකාධිපතිවරයාටද උපදෙස් දුන්නේය.

## රේජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

රේජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි වර්තමාන තත්ත්වය රේජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පැහැදිලි කරන ලද අතර, පහත සඳහන් කරුණු පිළිබඳව කාරක සභාව දැනුවත් කරන ලදී.

- කොළඹ ප්‍රධාන කාර්යාලය තුළ නව මෘදුකාංගයක් පරීක්ෂා කරනු ලබමින් පැවතීම.
- උපත්, විවාහ හා මරණ විද්‍යුත් ලියාපදිංචිය ආරම්භ කර තිබීම.
- ඉඩම් විද්‍යුත් ලියාපදිංචිය මෑතකදී අරඹන ලද අතර, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල පහක් ආවරණය කරනු ලැබ ඇත. ( දළ වශයෙන් 69% පමණ)
- ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල 22 ක් මෙම වසර තුලදී ආවරණය කරනු ලැබීමට ඉලක්ක කර තිබේ.
- දෙවන අදියර තුළදී දැනට පවතින ඔප්පු පරිලෝකනය කර දත්ත පදනමට එකතු කරනු ලබන අතර, නව ඔප්පු විද්‍යුත් ලියාපදිංචි කිරිම ආරම්භ කළ හැකිය.
- ආරක්ෂිත පියවරක් ලෙස පරිලෝකනය කරන ලද ප්‍රතිබිම්භ, පද්ධතියෙහි වෙනස් ස්ථාන තුනක වෙනස් සර්වර් තුනක තැන්පත් කර තැබීම. එසේ හෙයින් ඔප්පු සඳහා 100% ආරක්ෂාවක් ලැබෙන අතර, අස්ථානගත වීමට ඉඩකඩ නොමැත.
- ඔප්පු ලියාපදිංචි කිරීම සඳහා ජනතාව විසින් ගෙවන ලද මුද්දර ගාස්තු සහ දේපළ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛනවල තොරතුරු පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ මෙම පද්ධතිය සම්බන්ධතා දෙකක් පවත්වා ගනියි.

පසුගිය දා ඇති වූ ගංවතුර තත්ත්වය තුලදී පුද්ගලයන් විසින් සිදු කරන ලද වැරදි ක්‍රියා සහ ස්වාභාවික හේතු මත ඔප්පුවලට සිදුව ඇති හානි පිළිබඳව කාරක සභාව විමසිය. ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල සී.සී.ටී.වී කැමරා සවි කිරීම මඟින් එම තත්ත්වය වළක්වනු ලැබ ඇති බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා පැවැසීය.

විගණන පරීක්ෂණයක් පවත්වා මෙම ආයෝජනයෙහි ඵලදායීතාවය අධ්‍යයනය කරන ලෙස සහ සාමාන්‍ය පාලනයන් සහ පාලනයන් පද්ධතිය සඳහා යෙදවීම පිළිබඳව සොයා බලන ලෙස කාරක සභාව විගණකාධිපතිවරයාට නියෝග කළේය.

## කොළඹ මහ නගර සභාව

කොළඹ මහ නගර සභාව තුළ දැනට පවතින තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව කොළඹ මහනගර සභා කොමසාරිස්වරයා පැහැදිලි කළේය.

- සියළුම අභ්‍යාන්තර කටයුතු පරිගණකගත කර තිබේ.
- බදු අංශය, බදු එකතු කිරීමේ ක්‍රියාවලිය සහ සැලසුම් අංශය ඉදිරි මාස 6 තුළ පරිගණකගත කිරීමට නියමිත වේ.
- පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කරනු ලබන්නේ නම් ගොඩනැගිලි සැලසුම් දින 02ක් තුළ අනුමත කළ හැකිය.
- බදු ගෙවීම් අන්තර්ජාලය ඔස්සේ සිදු කළ හැකිය. ණය කාඩ්පත හරහා සිදු කරනු ලබන ගෙවීම් භාර ගනු ලැබේ. කෙසේ වුවද, 2%ක කොමිස් මුදලක් අයකරනු ලබන හෙයින් අන්තර්ජාලය ඔස්සේ සිදු කරනු ලබන ගෙවීම් ජනප්‍රිය නොවේ.
- ගබඩා කාඩ් ක්‍රමයක් මගින් ගබඩාවන් වෙන වෙනම අධීක්ෂණය කරනු ලැබේ.
- මේ වන විට දේපළ 150,000ක තොරතුරු පරිගණක ගත කර ඇත.
- කොළඹ මහ නගර සභාවේ මුළු ආදායමෙන් ¼ ක් පමණ ලැබෙනුයේ වරිපනම් බදුවලිනි. (බිලියන 12)
- දැනට පවතින වරිපනම් තක්සේරු ක්‍රමය අක්‍රමවත් බැවින් වංචාවන් ඇතිවීමට ඉඩකඩ ඇත.
- අනවසර ඉදිකිරීම්වලින් බදු අය කර ගැනීම සඳහා යාන්ත්‍රණයක් නොමැත.
- අක්‍රමවත්භාවයන් වළක්වාලීම සඳහා වරිපනම් පිළිබඳ දැනුම්දීමේ පද්ධතිය තුළින්ම නිකුත් කළ යුතුය.
- වරිපනම් අය කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව හරහා සිදු කළ යුතු වේ.

බදු අය කිරිම සහ ආදායම එකතු කිරීම සඳහා අනිකුත් රටවල් විසින් අනුගමනය කරනු ලබන යහපත් ක්‍රියාපිළිවෙත් පිළිබඳව විමසූ කාරක සභාව එවැනි ක්‍රමවේදයන්ද සලකා බලන ලෙස කොමසාරිස්වරයාට නියෝග කළේය.

දේපළ තක්සේරු කිරීම් පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදු කොට මාසයක් ඇතුළත කාරක සභාවට වාර්තා කරන ලෙස කාරක සභාව විගණකාධිපතිවරයාට නියෝග කළේය.

## අනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

- අයතන විසි අටක සම්බන්ධීකරණය ඇතිව, අන්තර්ජාලය ඔස්සේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මූලික විධිවිධාන යොදා ඇත.

- ආරම්භයේදී මෙම ක්‍රමය හඳුන්වාදීම සඳහා ආයතන පහක් හඳුනාගනු ලැබුණි. එන්.එම්.ආර් ආයතනය, විදුලි සංදේශ නියාමන කොමිසම, මධ්‍යම පරිසර අධිකාරිය, පළිබෝධනාශක දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව එම ආයතන වේ.

- ඔක්තෝම්බර් මස පළමු වැනි දින වන විට, මෙම ආයතන වෙතින් අන්තර්ජාලය ඔස්සේ නිර්දේශ ලිපි ලබා ගැනීමට සැලසුම් සකස් කර තිබේ.

- 2017 පළමු කාර්තුව වන විට අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

- මොරටුව විශ්ව විද්‍යාලය වෙතින් මිළ ගණන් කැඳවා ඇති අතර, මෙම කාර්යය සඳහා උපදේශකයෙක් පත් කර තිබේ.

මෙම අන්තර්ජාල පද්ධතිය ක්‍රියාත්මක කළපසු දත්ත ඇතුළත් කිරීම හා පිරික්සීම සඳහා වැයවන කාලය අවම වන බැවින් නිර්දේශ ලිපි ලැබී ඇත්නම් පැය ½ තුළ බලපත්‍ර නිකුත් කළ හැකි බව සභාපතිවරයා විමසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් පාලන අධිකාරීවරයා ප්‍රකාශ කළේය. තම අයදුම්පත් හා සම්බන්ධ ක්‍රියාවලිය කවර අදියරක පවතීද යන්න සහ කිසියම් අඩුපාඩුවක් පවතීද යනන් පිලිබඳව සේවාදායකයාටද දැනුවත්වීමක් ලබැ ගත හැකිය.

සේවාදායකයන්හට දෙපාර්තමේන්තුවට පැමිණීමෙන් තොරව බලපත්‍ර ලබා ගැනීම සඳහා හැකියාව ලබා දීම පිණිස, 2017 දෙසැම්බර් මාසය වන විට, තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපදේශන ආයතනයේ සහයෝගය ඇතුව ප්‍රතිනිර්මාන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන බව පාලන අධිකාරීවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

භාණ්ඩ තොගයේ වටිනාකම මත ගාස්තු අය කරනු ලබන බැවින් දෙපාර්තමේන්තුව විසින් අය කරනු ලබන ගාස්තුව බලපත්‍ර ගාස්තුවක් විය යුතුද නැතහොත් බදු මුදලක් විය යුතුද යන්න පිළිබඳව කාරක සභාව විමසීය. මෙම ගැටළුව මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නියෝග කළේය.

අපනයන හා ආනයන පාලකවරයාගේ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව එකිනෙක හා අන්තර් සම්බන්ධතාවයක් සහිත ක්‍රියාවලීන් මත ක්‍රියාත්මක වන බැවින්

ක්‍රියාවලියෙහි වැඩි දියුණු කිරීම් හෝ ප්‍රතිනිර්මාණ අධ්‍යයනයක් සිදු කරනු ලබන්නේ නම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ හැකියාවක් ඇති බව තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ව්‍යාපෘති කළමනාකාරවරයා ප්‍රකාශ කළේය.

අභ්‍යන්තර හා පද්ධති විගණනයක් සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුළ පහසුකම් තිබේද යන්න නියෝජ්‍ය විගනකාධිපතිවරයා විමසීය. පද්ධති විශ්ලේෂකයකු හා අභ්‍යන්තර විගනකවරයකු බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කළද මෙහි නිලධාරීන්ගේ සේවය දේපාර්තමේන්තුව වෙත ලබා දී නොමැති බව පාලන අධිකාරීවරිය ප්‍රකාශ කළාය .ආදායම් පිළිබඳ විගනනයන් දිනපතා සිදු කරනු ලබන බවත්, පද්ධති විගණනයක් සිදු කිරීමට අවශ්‍ය වේ නම් පහසුකම් ලබා දිය හැකි බවත්, ඇය තවදුරටත් සඳහන් කළාය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

විද්‍යුත් - කෘෂිකර්ම ක්‍රමෝපායික මාර්ගෝපදේශ සංග්‍රහය දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ඇති අතර ,කෘෂිකර්මාන්තය තුල තොරතුරු සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා ඒ තුළ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත.

කෙසේ වුවද ජාතික නිරෝධායන සේවය සඳහා තවමත් ප්‍රතිනිර්මාණ ක්‍රියාවලියක් හඳුන්වා දී නොමැත. ජංගම යෙදවුම් සහ වෙබ් අඩවි හරහා ගොවියන්ට තොරතුරු ලබාදීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී .ශාක සහ ශාක නිෂ්පාදන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම කිසිදු ගාස්තුවක් අයකිරීමකින් තොරව සිදු කරනු ලැබේ. අපනයන පලපත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තුවක් අය කරනු ලැබේ. මෙම ක්‍රියාවලීන් සිදු කරනු ලබන්නේ අතිනි.

විද්‍යුත් ක්‍රමය යොදා ගනිමින් අපනයන බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබන රටවල් 16න් එකක් ලෙස ලෝක වෙළඳ සංවිධානය විසින් ශ්‍රී ලංකාව තෝරාගෙන ඇත . කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි සහයෝගය ඇතුව ආනයන බලපත්‍ර නිකුත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය ක්‍රමය හඳුන්වාදීම සඳහා වැඩකටයුතු අරඹා ඇත.

ස්වයංක්‍රීය රේගු දත්ත පද්ධතිය ඔස්සේ තනි කවුළු ව්‍යාපාතියක් ලෙස යම් යම් ආයතන වෙත ශ්‍රී ලංකා රේගුව හා සම්බන්ධතාවය ලබා දී ඇති බව විමසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් නියෝජ්‍ය රේගු අධිකාරීවරයා සඳහන් කළේය. **ශාක නිරෝධායන සේවයද** මෙම නියමු ව්‍යාපෘතියට ඇතුළත් කර ඇත.

- මෙම ක්‍රියාවලිය තුළ නිරෝධායන නිලධාරියට සිය අනුමැතිය විද්‍යුත් ක්‍රමය ඔස්සේ ශ්‍රී ලංකා රේගුව වෙත යැවිය හැකිය.

- මෙම ක්‍රමය යටතේ, සියළුම අවශ්‍ය තොරතුරු සපයනු ලැබ ඇත්නම් සහ කිසිදු විරෝධතාවයක් නොමැති නම් භෞතික පරික්ෂාවකින් තොරව භාණ්ඩ තොගය නිදහස් කළ හැකිය.

සත්ව නිෂ්පාදන අපනයනය කිරීමේදී ජාත්‍යන්තර සෞඛ්‍ය සහතිකයක් නිකුත් කරනු ලබබන බව **ප්‍රධාන නිරෝධායන නිලධාරියා** ප්‍රකාශ කළේය.

ආනයනකරුහට අන්තර්ජාලය ඔස්සේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කල හැකි අතර, නිෂ්පානදය අනයනය කළ පසු අදාළ ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු වේ. ස්වයංක්‍රීය රේගු තොරතුරු පද්ධතිය තුළ ප්‍රමාණ අංග දෙකක් ඇතුළත් කර ඇත.

- පරීක්ෂාව සිදු කරන තෙක් භාණ්ඩ තොගය නිදහස් කිරීම සඳහා සති දෙකක කාල පරිච්ඡේදයක් වැය කරනු ලැබේ.

- ශාක නිරෝධායනය යනු ආගන්තුක පළිබෝධ යම් යම් ප්‍රදේශ වෙත අළුතින් ඇතුළු වී පැතිරීම වැළැක්වීම සඳහා ගනු ලබන නීතිමය ක්‍රියාපටිපාටියකි.

- ශ්‍රී ලංකාවේ ශාක නිරෝධායන කටයුතු සඳහා අවශ්‍ය නීතිමය පසුබිම ප්‍රමාණ වශයෙන් සකසනු ලබන්නේ 1999 ඔක්තෝම්බර් මස 07 වැනි දින සම්මත කරන ලද 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත මඟිනි. ශ්‍රී ලංකාවේ ශාක සහ ශාකවල භෞතිකාරක්ෂාව කෙරෙහි හානිකර, අහිතකර හෝ විනාශදායක කිසියම් ජීවියකු ශ්‍රී ලංකාව තුළට ඇතුළු වී පැතිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන සැකසීම සඳහා වූ පාර්ලිමේන්තු පනතක් ලෙස ඉහත පනත හැඳින්විය හැකිය.

- ශාක ආරක්ෂණ පනත යටතේ පනවනු ලැබ ඇති නියෝග (1981 නොවැම්බර් මස 02 වන සඳුදා නිකුත් කරන ලද අංක 165/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය) මඟින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය, කෘෂිකර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සහ ආගන්තුක පළිබෝධ රටට ඇතුළුවීම වැළැක්වීම සඳහා යම් යම් ශාක හා ශාක නිෂ්පාදන ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කිරීම හා සීමා කිරීම සිදු කරනු ලැබේ.

- උදා:- දකුණු ඇමරිකානු කොළ අංකමාරයෙන් අපගේ රබර් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා (දැනට ශ්‍රී ලංකාවේ මෙම රෝගය දක්නට නොමැති අතර, එය රබර් වගාව විනාශ කරන රෝගයක් ලෙස හඳුනාගෙන ඇත) දකුණු ඇමරිකානු නිවර්තන ප්‍රදේශවල හෝ දකුණු ඇමරිකානු කොළ අංගමාරය දක්නට ලැබේ. කිසියම් රටක නිෂ්පාදනය කරන ලද සහ මෙරට තවදුරටත් වර්ධනය වී ප්‍රචාරනය විය හැකි කිසිදු ද්‍රව්‍යයක් ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇත.

- ආගන්තුක පලිබෝධක අප රට තුළට ඇතුළුවිම අපගේ කෘෂිකාර්මාන්තය විනාශ කරනවා පමණක් නොව අනිකුත් රටවල්වලට අපගේ කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කිරීම කෙරෙහිද බලපෑමක් ඇති කරයි.

- වර්තමානයෙහිදී ශ්‍රී ලංකාව තුළ තෙවුංචුං යන පළිබෝධකය සහ පොල් වගාවන් තුළ පොල් ගස් කහපාටට හරවා පොල් ගස් මිය යාමට හේතුවන පළිබෝධකය දක්නට නොලැබේ. සමහර බටහිර රටවල් විසින් කොහු නිෂ්පාදන ආනයනය කිරීමේදී කොහු භාණ්ඩ තොගය තුළ ඉහත කී පළිබෝධකය නොමැති විය යුතු බවට නියම කර ඇත. අපගේ රට තුළ රකී

පළිබෝධක නොමැති හෙයින් ඉහත කී නියමයන් සපුරාලීමේ හැකියාව අපහට දැන් ලැබී ඇත. කෙසේ වුවද එම පළිබෝධක දක්නට ලැබෙන රටක් වෙතින් ආනයනය කරන ලද භාණ්ඩ තොගයක් හරහා එකී පළිබෝධ අප රයෙහි කොහු නිෂ්පාදන අපනයනය කෙරෙහි ඍජුවම බලපානු ඇත.

- එලෙසම ශාක මුල් කෙරෙහි බලපාන යම් සිහින් පනුවන් විශේෂයක් ඇති අතර, මෙම පණු විශේෂය දැනට ශ්‍රී ලංකාවේ දක්නට නොලැබේ. ජපානය, කොරියාව සහ යුරෝපය විසින් පස තුළ මෙම පණුවන් නොමැති විය යුතු බවට නියම කර අති අතර, එම පණුවන් අපගේ පස තුළට ඇතුළු වුවහොත් අගේ හාක එකී රටවල් වෙත අපනයනය කිරීමට නොහැකි වනු ඇත.

- ශාක හා ශාක නිෂ්පාදන අහිතකර පළිබෝධකයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගය ගොඩනගන ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතියට ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. තවද පරිසරය හා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා සම්පාදනය කර ඇති මොන්ට්‍රියල් ගිවිසුමටද ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත.

- 2009 අංක 65 දරන කැලෑ පනත වන සංරක්ෂණ ආඥා පනත, සත්ව හා ශාක ආරක්ෂණ ආඥා පනත සහ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සම්මුතිය මඟින්ද ශාක හා ශාක නිෂ්පාදන ආනයනය සීමා කරනු ලැබේ.

## මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

- මෝටර් රථවාහන ලියාපදිංචි කිරීම ,පැවරීම සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සිදුකරනු ලබන්නේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් මඟිනි .
- නුදුරු අනාගතයේදී දිස්ත්‍රික්ක 17කට අන්තර්ජාල පහසුකම් සැපයෙනු ඇත.
- මෙම වසරේදී E-Motoring (ඊ-මෝටරින්) ව්‍යාපෘතිය දියත් කෙරෙනු ඇත.
- කාර්යාලවලට පැමිණීමෙන් තොරව සේවාවන් ලබා ගැනීම, විශේෂයෙන්ම වාහන ආනයනය කරනු ලැබීමේදී දෙපාර්තමේන්තුවේ දත්ත ගබඩාවට අන්තර්ජාලය මඟින් සම්බන්ධ වීම සහ රේගුවේදී ලියාපදිංචිය ලබාගැනීම ආදිය අපේක්ෂිතය.

කාරක සභාව විසින් විමසනු ලැබීමේදී ,නියෝජ්‍ය විගණකාධිපතිවරයා විසින් පළකරන ලද අදහස වූයේ, වාහන ලියාපදිංචි කිරීම මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේදී සිදු කිරීමේදී රේගුව මඟින් සපයනු ලබන තොරතුරු වෙනස් කිරීමේදී හැකියාවක් පවතින බවයි .රේගුවට අනුව ASYCUDA පද්ධතිය රජයේ විගණන පද්ධතිය සහ අභ්‍යන්තර විගණන පද්ධතිය යන දෙකටම සම්බන්ධ වේ. කිසියම් වැරැද්දක් සිදු කළහොත් එම වැරැද්ද පද්ධතිය තුළ වාර්තාගත වන අතර කිසිදු වෙනස්කම් සිදුකළ නොහැක .එහෙත් වාහන නිදහස් කිරීම සහ ලියාපදිංචි කිරීම අතර මානුෂීය මැදිහත්වීමක් පවතින බැවින් තොරතුරු ඉලෙක්ට්‍රෝනික අයුරින් සන්නිවේදනය කිරීම සඳහා පද්ධතියක් වැඩිදියුණු කළ යුතුය.

වාහන මුදාහැරීම පිළිබඳ තොරතුරු දත්ත ගබඩාවට ඇතුළත් කළ විට ,වැරැදි සිදුවිය හැකි බවත් එම ගැටලුව නිවැරැදි කර ගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා ආරම්භ කොට ඇති බවත් සහකාර කොමසාරිස්වරයා (තොරතුරු තාක්ෂණ) විසින් පැහැදිලි කරන ලදී. ඔහු තවදුරටත් පහත පරිදි ප්‍රකාශ කරන ලදී.

- කැබිනට් මණ්ඩලය විසින් BOT ක්‍රමය යටතේ ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අනුමත කොට ඇත.
- ප්‍රසම්පාදන ලේඛන දැනටමත් පිළියෙළ කොට ඇත.
- ඊ - මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම BPA වලංගු කිරීම සිදු කරනු ඇත.
- වර්තමානයේ SMS, ජංගම දුරකථන, අන්තර්ජාල පහසුකම් පාරිභෝගිකයන් වෙත සපයනු ලැබේ.

විගණන පරීක්ෂුම් සඳහා පහසුකම් සහිතව මෙම අලුත් පද්ධතිය ස්ථාපිත කළ යුතු බව නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ අදහස විය .

වාහන අපද්‍රව්‍ය සහ පරිගණක වැනි ඉලෙක්ට්‍රෝනික භාණ්ඩ අපද්‍රව්‍ය පිළිබඳ ගැටලුව ඉදිරියේදී ප්‍රබල ගැටලුවක් බවට පත්විය හැකි අතර ඒ පිළිබඳව කාරක සභාව අවධානය යොමු කරන ලදී .වාහන ආනයනය කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බැවින් මෙම ගැටලුව අඩුකිරීම සඳහා අලුත් ආකාරයේ පිළියම් ගත යුතු බවට කාරක සභාව තීරණය කරන ලදී .එසේම රජය විසින් ආනයනය කරන ලද වාහන සම්බනධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමත් ,නවනිති සම්පාදනයන් හඳුන්වාදීමත් සිදුකළ යුතුය.

වාහන ආනයනය කිරීමේදී ගෙවීම් සිදුකිරීමේ ක්‍රියාවලිය සම්බන්ධවනුයේ රජයේ බැංකු පමණක් බැවින් මෙම ගෙවීම් සිදුකිරීමේ ක්‍රමය අකාර්යක්ෂම බව කාරක සභාවේ අදහස විය .ශ්‍රී ලංකා රේගුවට අනුව ,මෙම ක්‍රියාවලිය වෙනස් කිරීම සඳහා මහ බැංකුව Lanka Clear (pvt) Ltd (ලංකා ක්ලියර් පෞද්ගලික සමාගම (සමඟ සාකච්ඡා පවත්වමින් සිටී .Lanka Clear (pvt) Ltd ආයතනයේ බැංකු සේවා ප්‍රධානි විසින් පහත පරිදි සඳහන් කරන ලදී.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම Lanka Clear (pvt) Ltd මඟින් ආරම්භ කිරීමට මහ බැංකුව විසින් උපදෙස් දී ඇත.
- යෝජනා සඳහා ඉල්ලීම් *[RFP (Request for Proposal)]* ඉදිරිපත් කිරීමට.

RFP සඳහා ප්‍රතිචාරයක් ඔවුන් වෙත ලැබී ඇත.

ඔවුන් මහ බැංකුවෙන් අනුමැතිය ලබා ගනිමින් සිටී.

ලංකා බැංකුව හරහා ඉලෙක්ට්‍රෝනික ආකාරයට ගෙවීම් සිදුකිරීම සඳහා පහසුව පෞද්ගලික බැංකු සඳහාද ලබාදිය හැකි බව ලංකා බැංකු නිලධාරින් විසින් ප්‍රකාශ කරන ලදී .

රියදුරු බලපත්‍රයේ චිප් තිරුව තුළට ඇතුළත් කරනු ලබන රියදුරන් වෙත අකුසලතා ලකුණු ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳව කාරක සභාව විමසන ලදී.

- පොලීසිය සහ අධිකරණය මෙම ක්‍රියාවලිය තුළට සම්බන්ධ වී සිටින බැවින් ඔවුන් වෙතද මෙම පහසුකම සැලසිය යුතුය.
- පවත්නා නීතිරීති සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කොට ඇත.

අයදුම්කරුවන් වෙත වෛද්‍ය සහතිකය නිකුත් කිරීමේදී එම සහතික නිකුත් කරනු ලබන ආයතනය මඟින් පරිගණක පද්ධතිය වෙත ලබා දෙනුයේද යන්න පිළිබඳව ප්‍රශ්න කිරීමේදී ඒ.එල්.කේ.එච්.එම්. බණ්ඩාර මහතා විසින් පැහැදිලි කරන ලද්දේ තත් කාලීන දත්ත ඒකාබද්ධ කිරීම සහ වලංගුභාවය සහතික කිරීම සමඟින් මෙම ක්‍රියාවලිය සිදුකළ හැකි බවයි.

- ජංගම යෙදවුම් සහ වෙබ් අඩවි තුළින් ගොවීන් වෙත තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය දැනට සිදුකරමින් පවතී.

- WTO යටතේ ඉලෙක්ට්‍රෝනික පද්ධති තුළින් අපනයන නිෂ්පාදන පිළිබඳ සහතික නිකුත් කිරීම ක්‍රියාවේ යොදවන රටවල් 16න් එකක් වශයෙන් ශ්‍රී ලංකාව තේරී ඇත.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය සහිතව ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී තොරතුරු තාක්ෂණ හඳුන්වාදීමට මුල පිරීම් සිදුකොට ඇත.

විමසීම් කිරීමේදී රේගු නියෝජ්‍ය අධිකාරිවරයා විසින් ප්‍රකාශ කරන ලද්දේ ASYCUDA පද්ධතිය යටතේ 'සින්ගල් වින්ඩෝ' ක්‍රමය (Single–Window) ව්‍යාපෘතියක් වශයෙන් ශ්‍රී ලංකා රේගුව වෙත සම්බන්ධ වීමේ පහසුව ඇතැම් ආයතන වෙත සපයා ඇති බවයි. ශාක නිරෝධායනය කිරීමේ සේවාවද නියමු ව්‍යාපෘතිය තුළට ඇතුළත් කොට ඇත.

- මෙම ක්‍රියාවලියේදී නිරෝධායනය කිරීමේ නිලධාරියාට අනුමැතිය ඉලෙක්ට්‍රෝනික ආකාරයෙන් ශ්‍රී ලංකා රේගුව වෙත එවිය හැකිය.

අවශ්‍ය සියලු තොරතුරු සපයා තිබේ නම් මෙම ක්‍රමය යටතේ භෞතික පරීක්ෂාවකින් තොරව භාණ්ඩ තොගය මුදා හැරිය හැකිය.

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය

මෙම ඒකකයේ ප්‍රධාන වගකීම් සහ කාර්යභාරයන්ට ඇතුළත් වනුයේ ජාතිය වෙත ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සහ එමඟින් සෞඛ්‍ය සම්පන්න නොවන තත්ත්වයන් වළක්වමින් සෞඛ්‍ය සම්පන්න තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීම ,නොමඟ යවන සුළු ආකාරයේ ආහාර ප්‍රවර්ධනය කිරීම් වැළැක්වීම සහ ඒ මඟින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම ,ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලු පැන නඟින විට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම ,අයඩින් ඌනතා ආබාධ මර්දනයකිරීමේ වැඩසටහන ,අන්තර්ජාතික ආහාර ප්‍රමිති කොමිසම සමඟ කටයුතු කිරීම සහ ලෝක වෙළෙඳ සංවිධානය සහ ශාක සෞඛ්‍යාරක්ෂක එකඟතාවය සමඟ කටයුතු කිරීම යනාදියයි.

- ආහාර පාලන ඒකකය (FCU) ද අභ්‍යන්තර සහ පොදු විගණනයට ලක් වේ.
- 1980 අංක 26 දරන ආහාර පනත සහ එයට අදාළ සංශෝධන, ආහාර පනත යටතේ සකසන ලද රෙගුලාසි සහ අනෙකුත් නීති පැණවීම් තුළින් මෙම ඒකකයේ නියාමන රාමුව සැකසේ.
- සිය රාජකාරි ඉටුකිරීමේදී, ශ්‍රී ලංකා රේගුව, රජයේ රස පරීක්ෂක ආයතනය සහ අනෙකුත් ආහාර රසායනාගාර සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ සෞඛ්‍ය ආයතනය වැනි අනෙකුත් ආයතනයන් සමඟ සම්බන්ධවීම අවශ්‍ය වේ.
- ශ්‍රී ලංකාව වෙත ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේදී ඒවා ආහාර පාලන ඒකකය (FCU) මඟින් පරීක්ෂා කිරීමත් අවශ්‍ය පරීක්ෂණ සිදුකිරීමත් නිර්දේශ සිදුකිරීමත් සිදු වේ.
- කාර්යාල ඉඩකඩ සහ මානව සම්පත් නොමැතිවීම සහ අනෙකුත් ගැටලු හේතුවෙන් තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධතියක් නොමැත.
- විගණන කළමනාකරණයට අමතරව ආහාර විෂවීම දැනුම්දීම සහ විමර්ශනය, ආහාර රසායනාගාර ජාලය, ස්වදේශීය ආහාර නිෂ්පාදන සඳහා බලපත්‍ර ලබාදීම, ආහාර ආනයන දත්ත සැකසීම සහ ආදායම් එකතු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය අවශ්‍ය වේ.

### කාරක සභාව මඟින් සිදුකරන ලද නිරීක්ෂණ

ආහාර පාලන ඒකකය (FCU) මඟින් රේගුව සමඟ එක්ව කටයුතු කිරීමට සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීමට සහ ඉලෙක්ට්‍රෝනික ආකාරයෙන් සන්නිවේදනය කිරීමට සහ එමඟින් නීත්‍යානුකූල වෙළෙඳාම් ඉක්මනින් නිෂ්කාශනය කිරීමට සහ නීත්‍යානුකූල නොවන වෙළෙඳාම් පිළිබඳ කටයුතු වඩා සාධනීය සහ කාර්යක්ෂම ආකාරයකින් ආමන්ත්‍රණය කිරීමට හැකියාව නිර්මාණය කිරීමට.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

මෙම ආයතනය මඟින් සිදුකරනු ලබන කාර්යයන් වනුයේ ප්‍රමිති සකස් කිරීම (SLS ලාංඡනය) සම්බන්ධයෙන් සේවාවන් සැපයිම මුදාහැරීමට පෙර ආනයනය කරනු ලබන භාණ්ඩ 120ක් සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදු කිරීම, පද්ධති සහතිකරණය (ISO 9000 සහ ISO 14000 වැනි කළමනාකරණ පද්ධති නිකුත් කරනු ලැබේ) උපකරණ සඳහා රසායනාගාර ක්‍රමාංකන සේවාවන්, කර්මාන්ත විසින් ස්වකීය නිෂ්පාදන පරීක්ෂාවට ලක්කිරීම සඳහා රසායනාගාර සේවාවන් තත්ත්ව කළමනාකරණය සඳහා කර්මාන්ත වෙත පුහුණුව ලබා දීමයි .

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආනයන පරීක්ෂාවන් සිදුකිරීමේදී රේගුව වැනි අනෙකුත් ආයතන සමඟ සබඳතාවයන් පවත්වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පානීය ජල බෝතල් පිළිබඳ අනුමැතිය ලබා දීමේදී නිෂ්පාදන සහතිකකරණයද සිදුකෙරේ .

ඔවුන් විසින් සපයනු ලබන සේවාවන් තුළ තොරතුරු තාක්ෂණ භාවිතය -

- දැනට, තොරතුරු තාක්ෂණය මඟින් සේවාවන් සැපයීමේ සම්මත ක්‍රමයක් නොපවතී.
- ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු තාක්ෂණය භාවිතා කරනු ලැබේ.
- ශ්‍රී ලංකා රේගුව වැනි බාහිර ආයතන සමඟ කටයුතු කිරීමේදී විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.
- ආයතනය දැන් ASYCUDA පද්ධතියට සම්බන්ධ කොට ඇත.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි තත්ත්ව සහතික කිරීමේ අංශය විසින් ආනයන පිළිබඳව ගනු ලබන තීරණය ශ්‍රී ලංකා රේගුව වෙත අතින් ගෙනගොස් දෙනු ලැබිණි. එහෙත් එම තීරණය ශ්‍රී ලංකා රේගුව වෙත ඉලෙක්ට්‍රෝනික අයුරින් යැවීම සඳහා වර්තාමනයේ ASYCUDA පද්ධතිය වෙත ඔවුන්ට ප්‍රවේශය ඇත.
- මෙම ක්‍රියාවලිය වඩාත් පහසුකිරීම සඳහා රේගුව මඟින් තවත් මෙවලමක් සපයා ඇත. කෙසේ වුවද එය තවමත් පරීක්ෂණ මට්ටමේ පවතී.
- අන්තර් ජාලය ඔස්සේ සිදුකරන වෙනත් විශේෂිත ගනුදෙනු නොපවතී.
- වෙබ් අඩවිය යළි සැකසුම් කිරීමේ කටයුතු බාහිර පාර්ශ්වයන් මඟින් සිදුකරගනු ලැබේ.

- මාස 3–4ක කාලයකදී, සපයනු ලබන සේවාවන් සඳහා අන්තර්ජාලය ඔස්සේ ගෙවීම් සිදු කිරීමට හැකි තත්ත්වයක් පාරිභෝගිකයින් වෙත ලැබෙනු ඇත.

- මෙහි පවතින ප්‍රධාන ගැටලුව වනුයේ අනෙකුත් අංශ හා අන්තර් සම්බන්ධිත ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැති වීමයි.

- උපදේශකවරයෙකුගේ සහාය සහිතව පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් දියත් කෙරෙනු ඇත.

- තොරතුරු තාක්ෂණ යටිතල පහසමුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය වේ.

- අනුගාත සැලසුම්.

- ඒකාබද්ධ කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

- තොරතුරු තාක්ෂණ අංශය වැඩිදියුණු කෙරෙනු ඇත.

## ලංකා බැංකුව

- ආනයන සහ අපනයන ගෙවීම්වලදී, රේගුවට අන්තර්ජාලය ඔස්සේ හෝ බැංකුවට පැමිණ ගෙවීම් සිදු කළ හැකිය.
- වලංගු කිරීම සිදුකරනු ලැබේ.
- ගෙවීම් අන්තර්ජාලය ඔස්සේ රේගුව වෙත යවනු ලැබේ.
- අභ්‍යන්තර පද්ධතියක් මඟින් පාරිභෝගිකයන් ගනුදෙනුව වලංගුභාවයට පත් කරන අතර එවිට ලැබෙන තොරතුරු සමාන නොවේ නම් ගනුදෙනුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- රේගුව වෙතින් මුදල් ලැබීම පිළිබඳ දැනුම්දීමක් ලැබේ.
- ලංකා බැංකුව මඟින් සපයනු ලබන වාර්තාවල උපකාරයෙන් රේගුව විසින් සැසඳීම් සිදුකරනු ලැබේ.

**බී-2 ඇමුණුම**

## ප්‍රශ්නාවලිය සහ පිළිතුරු

**1. කාරක සභාවෙන් යවන ලද ප්‍රශ්නාවලියට පිළිතුරු වශයෙන් රේගුවෙන් ඉදිරිපත් කරන ලද අතිරේක තොරතුරු**

- **රේගු ප්‍රකාශ අනුව බලන කළ 2015 වර්ෂය තුළ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ ආනයනය කළ භාණ්ඩ තොග සංඛ්‍යාව කොපමණ වේද?**

  2015 වර්ෂය තුළ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ සිදුකළ ආනයනය කිරීම් සම්බන්ධ ප්‍රකාශ පහත පරිදි වේ:

  2015 වර්ෂය :රේගු ප්‍රකාශ 619,140

  2016 මුල් අර්ධය :රේගු ප්‍රකාශ 296,784

- **2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ ලේඛන සත්‍යාපනයකින්/ පරීක්ෂාවකින් තොරව නිදහස් කළ මුළු ආනයනිත භාණ්ඩ තොග සංඛ්‍යාව කොපමණ වේද?**

  ○ ලේඛන සත්‍යාපනය කිරීමෙන් හෝ පරීක්ෂා කිරීමෙන් තොරව කිසිදු භාණ්ඩ තොගයක් නිශ්කාෂණය කරනු නොලැබේ .කෙසේ නමුත්, පරීක්ෂා කිරීමෙන් තොරව භාණ්ඩ තොගයක යම් කොටසක් නිදහස් කිරීමට ඉඩ තිබේ.

- **2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ භාණ්ඩ සත්‍යාපනයකින්/ පරීක්ෂාවකින් තොරව නිදහස් කළ මුළු ආනයනිත භාණ්ඩ තොග සංඛ්‍යාව කොපමණ වේද?**

  ○ පිළිතුර ඉහත පරිදිම වේ .භාණ්ඩ සත්‍යාපනය කිරීමෙන් හෝ පරීක්ෂා කිරීමෙන් තොරව කිසිදු භාණ්ඩ තොගයක් නිශ්කාෂණය කරනු නොලැබේ .කෙසේ නමුත්, පරීක්ෂා කිරීමෙන් තොරව භාණ්ඩ තොගයක යම් කොටසක් නිදහස් කිරීමට ඉඩ තිබේ.

- **2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ නීති විරෝධී ආනයන වශයෙන් හඳුනාගත් භාණ්ඩ තොග සංඛ්‍යාව කොපමණ වේද? (දැනට විමර්ෂණය කෙරෙමින් පවතින භාණ්ඩ තොග ද ඇතුළුව)**

  ○ 2015 වර්ෂයේ ලියාපදිංචි රේගු නඩු සංඛ්‍යාව 10,436ක් වන අතර 2016 මුල් අර්ධයේදී එය 2084ක් විය.

- **2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ නීති විරෝධී වෙළඳාම්වලින් සිදුකළ අයකරගැනීම්වල මුළු අගය කොපමණ වේද?**
  - 2015 වර්ෂයේ මුළු අයකරගැනීම් රුපියල් 5,021,583,233.40 436ක් වන අතර 2016 මුල් අර්ධයේදී එය රුපියල්2 ,719,568, 711ක් විය.
- **2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ ආනයන හරහා උපයාගත් මුළු ආදායම කොපමණ වේද?**
  - 2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ ආනයන හරහා උපයාගත් මුළු ආදායම පහත පරිදි වේ:
  - 2015 වර්ෂය :රුපියල් 625,378,027,) 967වැට් බද්ද ඇතුළුව(
  - 2016 මුල් අර්ධය :රුපියල් 350,327,074,542
- **නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සලසමින් නීති විරෝධී වෙළඳාමට මැඩලීමට යොදවා ඇති අවදානම් කළමනාකරණ ක්‍රමය කුමක්ද?**
  - ආනයන අවදානම් කළමනාකරණ ක්‍රමය පරිගණකගත කර තිබේ.
- **සිංගල් වින්ඩෝ (single window) ක්‍රමය (ජාත්‍යන්තර වෙළඳුන්හට තම නියාමන ලේඛන එකම ස්ථානයක්/ අධිකාරී ආයතනයක් වෙත ඉදිරිපත් කළ හැකි ක්‍රමයකි ) යොදාගැනීමේ අරමුණ සහ එහි වත්මන් තත්වය කුමක්ද?**
  - සිංගල් වින්ඩෝ ක්‍රමයෙහි අරමුණ වන්නේ සියළුම නියාමන ආයතන එකිනෙක සම්බන්ධ කිරීම තුළින් ඉලෙක්ට්‍රොනික ක්‍රමයට සියළුම අනුමැති සහ බලපත්‍ර ලබාදීමයි .වත්මන් තත්වය නම්, රේගුව මේ සඳහා සූදානම් නමුත් බොහෝ නියාමන ආයතන තවමත් පරිගණකගත කර නොමැත.

## 2. කාරක සභාවෙන් යවන ලද ප්‍රශ්නාවලියට පිළිතුරු වශයෙන් ආනයන අපනයන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ලද අතිරේක තොරතුරු

- **2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ ආනයන පාලන බලපත්‍ර (ICL) වුවමනා වූ මුළු භාණ්ඩ තොග සංඛ්‍යාව කොපමණ වේද?**

  2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේ මුල් අර්ධය තුළ නිකුත් කළ මුළු ආනයන පාලන බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ:

| කාල සීමාව | | ආනයන පාලන බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| 2015 (01.01.2015 – 31.12.2015) | ... | 14,927 |
| 2016 (01.01.2016 – 30.06.2016) | ... | 7,112 |

- **නිර්දේශ කළ බලධාරියා අනුව ඉහත තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කරන්න. උදා: පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා ගේ නිර්දේශය මත ආනයන පාලන බලපත්‍රය ලබාගැනීමට සිදුවූ පලිබෝධනාශක තොග සංඛ්‍යාව**

| අංකය | නිර්දේශ කළ බලධාරියා | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| 1 | විදුලි සංදේශ නියාමන කොමිසම | 3831 |
| 2 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2106 |
| 3 | සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අමාත්‍යාංශය | 1974 |
| 4 | පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා | 1427 |
| 5 | රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව | 1106 |
| 6. | ඛණිජ තෙල් හා ඛණිජ තෙල් නිෂ්පාදන අමාත්‍යාංශය | 945 |
| 7 | සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය | 414 |
| 8 | සුරාබදු දෙපාර්තමේන්තුව | 334 |
| 9 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 300 |
| 10 | වෙනත් (ආයතන 49කි ) | 2490 |
| | **එකතුව** | **14927** |

- **ආනයන පාලන බලපත්‍ර යටතේ භාණ්ඩ තොග නිෂ්කාශනය කිරීමේදී නිර්දේශ කරන බලධරයාගේ සහ රේගුවේ භූමිකා කවරේද?**

  ආනයන පාලන බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථමයෙන් අදාළ නිර්දේශක ආයතනය විසින් නිර්දේශ ලිපියක් නිකුත් කරනු ඇත .භාණ්ඩ ගෙන ආ පසු,

එවන් භාණ්ඩ තොග ආනයනකරුට නිදහස් කිරීමට පෙරාතුව ආනයන පාලන බලපත්‍රය ඇතුළු සියළුම ලේඛන හා නියැදි ශ්‍රී ලංකා රේගුවේ පරීක්ෂාවට ලක් වේ.

- **ආනයන භාණ්ඩ තොග නිෂ්කාශනයේදී රේගුව සහ ආනයනකරුවන් තම කටයුතු සිදු කිරීම සඳහා දැනට භාවිතා කරන කාර්ය පටිපාටිය කුමක්ද? තොරතුරු තාක්ෂණය තුළින් මෙම ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද?**

  ආනයනකරු වෙත ආනයන පාලන බලපත්‍රය නිකුත් කළ පසු භාණ්ඩ ආනයනය කළ හැකිය .බලපත්‍රය ලබාගත් පසු ආනයනකරු භාණ්ඩ ආනයනයට සුදුසුකම් ලබයි .භාණ්ඩ මෙරටට ගෙන ආ පසු භාණ්ඩ තොග හිමිකරු ඊට අදාළ රේගු ලේඛන නැතහොත් CUSDEC ශ්‍රී ලංකා රේගුවේ "Ashikuda" නැමැති මාර්ගගත (online) පද්ධතිය හරහා ඉදිරිපත් කළයුතු වේ. ඉන් අනතුරුව රේගු ලේඛනය සහ අදාළ වන අනෙකුත් නැව්ගත කිරීමේ ලිපි ලේඛන හර කිරීම සඳහා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතුය. ආනයන පාලන බලපත්‍රය හර කිරීමෙන් අනතුරුව,නිශ්කාෂණය සඳහා සියළුම ලිපි ලේඛන ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කළයුතු වේ.

  බලපත්‍ර සම්බන්ධයෙන් සහ හර කිරීම් සම්බන්ධයෙන් වන තොරතුරු හුවමාරුව සඳහා, බලපත්‍ර නිකුත් කිරීම සහ ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ හර කිරීම් පද්ධතිය ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතිය සමගින් සම්බන්ධ කර ඇත.

- **නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සලසමින් නීති විරෝධී වෙළඳාමට මැඩලීමට යොදවා ඇති අවදානම් කළමනාකරණ ක්‍රමය කුමක්ද?**

  1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ පල කරන අතිවිශේෂ ගැසට් නිවේදන හරහා ආනයන හා අපනයන පාලනයට නතුවන භාණ්ඩ සහ තහනම් කළ භාණ්ඩ කවරේදැයි ප්‍රකාශයට පත් කරනු ලැබේ .යම් පුද්ගලයකු ආනයන පාලන බලපත්‍ර වුවමනා කරන එවන් භාණ්ඩ හෝ තහනම් භාණ්ඩ ආනයනය කරන්නේ නම් එවන් භාණ්ඩ ස්වයංක්‍රීයවම ශ්‍රී ලංකා රේගුවෙන් ඔවුනට අහිමි කරවනු ඇත.

  ගෙවුම් කොන්දේසි නියාමනය ක්‍රියාත්මක කිරීම සඳහා පහත පරිදි කටයුතු කරනු ලැබේ.

  - අත්තිකාරම් සීමාව ඇමෙරිකානු ඩොලර් 50,000ක් හෝ ඊට සමාන වන විදේශ මුදල් ප්‍රමාණයකට සීමා කර ඇති අතර අත්තිකාරම් වටිනාකම ඇමෙරිකානු ඩොලර් 50,000 ඉක්මවන්නේ නම් විදේශ බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීම හෝ FCBU ගිණුමක් හරහා එම අත්තිකාරම් මුදල මාරු කිරීම සිදුකළ යුතුය.

- වාහනයක් ආනයනය කිරීම සඳහා සපුරාලිය යුතු සියළුම අවශ්‍යතා සපුරා ඇත්නම් ණයවර ලිපියක් ඇතිව පමණක් මෝටර් වාහන ආනයනය කළ හැකිය.
- නැව්ගත කිරීම් ලිපි ලේඛනවල යම් විෂමතාවයන් පෙනුනහොත් එම ලේඛන නිදහස් කරගැනීම සඳහා ආනයන හා අපනයන පාලක ජෙනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීමට ආනයන කරුවන් යොමුකිරීමට සියළුම වාණිජ බැංකු විසින් කටයුතු කරනු ලැබේ.
- බැංකුවල 'මෙහෙයුම් අත්පොත්' වශයෙන් භාවිතා කිරීම සඳහා සහ ආනයන අපනයන පාලන රෙගුලාසි සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම සඳහා සැම අතිවිශේෂ ගැසට් පත්‍රයක්ම සියළුම වාණිජ බැංකු වෙත යවනු ලැබේ.
- රාජ්‍ය ගිණුම් කාරකසභාවේ නියෝග ප්‍රකාරව සහ 1969 අංක 1 දරන ආනයන අපනයන පාලන පනත ප්‍රකාරව, නීතිවිරෝධී වෙළඳාම අධීක්ෂණය සඳහා විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබේ.

- **පාවිච්චි කළ මෝටර් වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිය කුමක්ද? ආයෝජන මණ්ඩලයේ (BOI)සමාගම් විසින් ආනයන පාලන බලපත්‍ර යටතේ ආනයනය කරන භාණ්ඩ තොග සම්බන්ධයෙන් වත්මන් තත්වය කුමක්ද?**

  මෝටර් වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තියක් සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයෙන් මේ වනවිටත් ඉදිරිපත් කර තිබේ .ආයෝජන මණ්ඩල (BOI) සමාගම් සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමට විශේෂිත ක්‍රමවේදයක් නොමැත .එහිදී ආනයන පාලන බලපත්‍ර නිකුත් කරනුයේද සාමාන්‍ය සමාගම් සඳහා බලපත්‍ර නිකුත් කරන අන්දමටම ය.

- **දෙපාර්තමේන්තුව විසින් ආනයනකරුවන්ගෙන් අයකර ගනු ලබන ගාස්තු මොනවාද? එම ගාස්තු අයකර ගැනීමේදී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය/ තාර්කික පදනම කුමක්ද?**

  1969 අංක 01 දරණ ආනයන අපනයන පාලන පනත යටතේ ගරු අමාත්‍යවරයාට පැවරී තිබෙන බලතල අනුව ආනයන අපනයන බලපත්‍ර ගාස්තු සහ අයකරනු ලබන අනෙකුත් ගාස්තු අතිවිශේෂ ගැසට්පත්‍රයක් මගින් ප්‍රසිද්ධ කර තිබේ

**3. කාරක සභාව විසින් යවන ලද ප්‍රශ්නාවලියට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිරෝධායන අංශය පහත සඳහන් පරිදි පිළිතුරු ඉදිරිපත් කර ඇත:**

- **2015 වර්ෂය සහ 2016 වර්ෂයේ මුල් භාගය තුළදී දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වූ මුළු ආනයන තොග සංඛ්‍යාව කොපමණද?**

| වර්ෂය | අනුමත කරන ලද ආනයන අවසරපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| 2015 | 3220 |
| 2016 (ජූනි මාසය දක්වා) | 2034 |

- **ආනයනික තොග නිදහස් කර ගැනීම සඳහා රේගුව සහ ආනයනකරුවන් සමග කටයුතු කිරීමේදී වර්තමානයේ අනුගමනය කරනු ලබන ලබන කාර්ය පටිපාටිය කුමක්ද? තොරතුරු සංනිවේදන තාක්ෂණය යොදාගනිමින් මෙම ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර මොනවාද?**

  - ගුවන් සේවය හෝ ආනයන කරු විසින් බඩු තොග පැමිණ ඇති බව දැනුම් දීම.
  - ආනයනයට අදාළ ලේඛන පරීක්ෂාවෙන් අනතුරුව ආනයනකරු විසින් රේගු සටහන ලබාගත යුතුය.
  - ඉන් අනතුරුව බඩු තොගය ශාක නිරෝධායන අංශයේ තීරණය ලබා ගැනීම සඳහා එම අංශයට යොමු කරනු ලැබේ.
  - බඩු තොග පැමිණි විට, ආනයන කරු විසින් බඩු තොග මෙරටට ඇතුල්වූ තොටෙහිදී ශාක නිරෝධායන පරීක්ෂකවරයාට ආනයනයට අදාළ විස්තර සපයා දිය යුතු අතර එම පරීක්ෂකවරයා විසින් ශාක ආනයන ප්‍රවේශ පත්‍රිකාව භාවිතා කරමින් භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙනු ලබයි.
  - අදාළ ලිපි ලේඛන (ශාකසෞඛ්‍යාරක්ෂක සහතිකය, ධූමකරණ සහතිකය, සෞඛ්‍ය සහතිකය, ISTA, Non GMO යනාදිය) පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඩු තොගය ශාක නිරෝධායන පරීක්ෂකවරයෙකු විසින් පරීක්ෂා කළ යුතුය.
  - ආනයනය නීත්‍යානුකූලව සිදු කර ඇත්නම් සහ අවසරපත්‍ර කොන්දේසි සම්පූර්ණ කර ඇත්නම්, බඩු තොගය නිදහස් කිරනු ලැබිය හැක.
  - අවශ්‍ය යැයි සිතන්නේ නම්, බඩු තොගය තව දුරටත් පරීක්ෂාවට භාජනය කළ හැකි ඇති අතර එය පලිබෝධවලින් තොර වන්නේ නම්, රට තුළට ගෙනඒම සඳහා තිබිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව බඩු තොගය නිදහස් කරනු ලැබිය හැක.

- අවශ්‍ය යැයි සිතන්නේ නම්, බඩු තොගය නිදහස් කිරීමට පෙර ප්‍රතිකාර කිරීමට භාජනය කරනු ලැබිය හැක.
- අවශ්‍ය අනුමැතිය සහ සහතික කිරීම් නොමැති නම් සහ ශාකවල හෝ ශාක නිෂ්පාදනවල අනතුරුදායක රෝගකාරක, කෘමීන්, පළිබෝධ, මයිටා, පණුවන් හෝ වල්පැලෑටි අඩංගු වන්නේ නම් ශ්‍රී ලංකාව තුළට ගෙනඒමට අවසර දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අතර

**ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා?**

අනතුරුදායක පළිබෝධ හඳුනාගැනීම සහ අපගේ වෙළඳ හවුල්කරුවන්ගේ අවශ්‍යතා පිළිබඳව ශාක නිරෝධායන නිලධාරීන් පුහුණු කිරීම, පහසුකම් වැඩිදියුණු කිරීම, පරිගණක ජාලගතකිරීම ආදිය අප රටට විදේශ වෙළඳපොළ සමග තරගාකාරීව කටයුතු කිරීම සඳහා ඉතාමත් වැදගත් වේ.

- **නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීමටත් ,නීති විරෝධී වෙළඳාමට එරෙහිව කටයුතු කිරීමටත් සකසා ඇති අවදානම් කළමනාකරණ ක්‍රමවේදය කුමක්ද?**

**නීත්‍යානුකූල වෙළඳාම සඳහා**

ඕනෑම වර්ගයක ශාක හෝ ශාක නිෂ්පාදනයක් ශ්‍රී ලංකාවට ආනයන කිරීම සඳහා ආනයන අවසරපත්‍රයක් ලබාගැනීම අනිවාර්ය වේ. යම් ආනයනකරුවෙකු අවසරපත්‍රයක් ඉල්ලුම් කළ විට, එය නිසි අවශ්‍යතාවලට අනුකූල නම් සහ තහනම් අයිතමයක් නොවේ නම්, සති දෙකක කාලයක් ඇතුළත අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබේ. එම අවසරපත්‍රය මාස තුනක කාලයක් සඳහා වලංගු වන අතර, විශේෂිත තත්ත්වයන් යටතේ මෙම කාලය තවත් මාස තුනක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැක.

බලපත්‍රය මගින් භාණ්ඩ තොගයට අදාළ පළිබෝධ නිදහස පිළිබඳ විශේෂිත කොන්දේසි ලබාදෙන අතර, එම කොන්දේසි සපුරා තිබීම ආනයනකරුගේ සහ අනෙක් රටෙහි සිටින අපනයන කරුගේ වගකීම වේ. ආනයනික භාණ්ඩ තොගය සමග අවශ්‍ය සහතික, විශේෂයෙන් ශාක සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ සහතික, ජාත්‍යන්තර බීජ පරීක්ෂණ සංගමයේ සහතිකය, ජානමය වශයෙන් වෙනස් නොකළ ජීවී සහතිකය ආදිය ඉදිරිපත් කළ යුතුවේ.

ආනයන කරන ලද ශාක සහ ශාක නිෂ්පාදන තොග ශාක නිරෝධායන නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය වන්නේ නම්, එම ද්‍රව්‍ය සඳහා පළිබෝධ පරීක්ෂාවක් සිදු කළ හැකි අතර එයට රසායනාගාර පරීක්ෂණ ද ඇතුළත් විය හැක. සමහර විට එම ද්‍රව්‍යවල තිබිය හැකි ආක්‍රමණශීලී පළිබෝධ විනාශ කිරීම සඳහා ඒවා විශේෂිත ප්‍රතිකාරවලට භාජනය කිරීම ද සිදු කරනු ලැබිය හැක.

**නීතිවිරෝධී වෙළඳාම සඳහා**

නීති විරෝධී ලෙස ආනයනය කරන ලද භාණ්ඩ විනාශ කිරීම හෝ ඒවා අපනයනය කරන ලද රටට ආපසු යැවීම සිදු කරනු ලැබේ .

**නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සැලසීම පිණිස අපනයන රටවල් අතර අන්‍යෝන්‍ය පිළිගැනීම් ගිවිසුමක් /ක්‍රමවේදයක් සකස් කර තිබේද?**

ඔව්.

ශාක සෞඛ්‍යාරක්ෂාව සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිත අංක 12 අනුව, පළිබෝධ පිළිබඳ අවධානයන් නියාමනයට අදාළව ආනයනය කරනු ලබන රටෙහි ආනයන නියමයන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ශාක සෞඛ්‍යාරක්ෂක සහතිකය නිකුත් කරනු ලැබේ .

රටවල් අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

NPO අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ඍජුවම සම්බන්ධ කර ගැනීම.

- **ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමාගම් විසින් ආනයනය කරනු ලබන අදාළ භාණ්ඩ පිළිබඳ වර්තමාන තත්ත්වය කුමක්ද?**

ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමාගම්වලින් සමහරක් ශාක නිරෝධායන නියමයන්ට අනුකූලව භාණ්ඩ තොග ආයනය කරනු ලබයි.

- **දෙපාර්තමේන්තුව විසින් ආනයනකරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තු මොනවාද? එම ගාස්තු අයකරනු ලබන්නේ කුමන ප්‍රතිපත්තියක් / තාර්කික පදනමක් මතද ?**

අය කරනු ලබන ගාස්තු 1981 නොවැම්බර් 02 දිනැති ගැසට්පත්‍රය මගින් නියම කර තිබේ. එම ගාස්තු භාස්‍යජනක තරම් ඉතාම අඩු ගාස්තු වේ; උදා: ශාක සෞඛ්‍යාරක්ෂක සහතිකයක් සඳහා ශාක නිරෝධායන ගාස්තුව රුපියල් 12 පමණක් වේ. ආනයන අවසර පත්‍රය නොමිලයේ නිකුත් කරනු ලැබේ.

PQS ගුවන් තොටුපළෙහිදී ආනයන පරීක්ෂණ ගාස්තුව තොගයකට රු.150/- ක් වේ. මෙම ගාස්තු පළිබෝධ හඳුනාගැනීම සඳහා වන විද්‍යාත්මක කාර්යයක් වන ශාඛ නිරෝධායන පරීක්ෂාවක් සඳහා අය කරනු ලැබේ. කෙසේ වෙතත්, මුහුදු තොටකදී ආනයනකරු විසින් වරාය භූමියෙහිදී වරාය අංගනයට ගාස්තු ගෙවනු ලබන නිසා මෙම ගාස්තු මුහුදු තොටෙහිදී භාණ්ඩ තොග සඳහා අදාළ කර ගනු නොලැබේ.

**4. කාරක සභාව විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත යවන ලද ප්‍රශ්නාවලියට පහත සඳහන් පරිදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි:**

- **ආහාර ආනයනයන්ට අදාළ නීතිමය පදනම සහ පරීක්ෂාකිරීම්වල / සත්‍යාපනය කිරීම්වල අරමුණ:**

  1980 අංක 26 දරණ ආහාර පනත මගින් අනෙකුත් දේ අතර ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම ආවරණය කරයි. ආහාර පනත මගින් කිසියම් ආහාර ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, අලෙවි කිරීම, සහ අලෙවි කිරීම සඳහා නිරාවරණය කර තැබීම, ගබඩා කර තැබීම හෝ බෙදාහැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම සිදු කරයි.

  එම පනත මගින් ප්‍රධාන ආහාර බලධාරියා විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත්කරනු ලබයි. රටතුළට ආහාර ද්‍රව්‍ය ගෙන එනු ලබන ස්ථානවල පිහිටි ආනයනික ආහාර පරීක්ෂණ ඒකකවලට නිසි බලය සහිත නිලධාරීන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් නම් කර ඇත.

  මූලිකවම ආනයනික ආහාර තොග පරීක්ෂා කිරීමේ අරමුණ වන්නේ අපවිත්‍රවූ හෝ බාල වර්ගයේ ආහාර ගැනීම හේතුවෙන් සිදුවිය හැකි බලපෑම්වලින් මෙරට පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමයි.

- **2015 වර්ෂය තුළ සහ 2016 වර්ෂයේ මුල් භාගයේදී ආනයන කළ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුවූ භාණ්ඩ තොග සංඛ්‍යාව:**

| වර්ෂය | තොග සංඛ්‍යාව |
|---|---|
| 2015 | 39,495 |
| 2016 මුල් භාගය | 22,814 |

- **රේගුව සහ ආනයනකරුවන් සමග කටයුතු කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය: තොරතුරු සංනිවේදන තාක්ෂණය හරහා එම ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග:**

  ආනයනික තොගවල නිෂ්පාදනයෙහි ස්වභාවය පිළිබඳ මූලික ඇගයීමක් සිදු කිරීම, වැඩිදුර පරීක්ෂණ සිදු කිරීම (අවශ්‍ය වන්නේ නම් සාම්පල රසායනාගාර පරීක්ෂාවට ලක්කිරීම ද ඇතුළුව) සහ ආනයනික අහාර තොග නිදහස් කරන්නේද, නැතහොත් වැඩිදුර පරීක්ෂණ සිදුකිරීම / ක්‍රියාමාර්ග ගැනීම සඳහා රඳවා තබාගන්නේ ද යන්න තීරණය කිරීම පිණිස එම තොගවල අනකූලතා මට්ටම පිළිබඳ රේගුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා රේගුව විසින් සුපුරුදු පරිදි එම තොග ආනයනික ආහාර පරීක්ෂණ ඒකකය වෙත යොමු කරනු ලබන අතර එම ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රධාන ආහාර බලධාරියා දැනුවත් කර තබයි. රේගුව විසින් භාණ්ඩ තොග රේගු භූමියේ සිටම හෝ ආනයනකරු විසින්

භාණ්ඩ තොග රැගෙන යන ස්ථානයට ගොස් පරීක්ෂාකිරීම සිදු කරනු ලැබේ. රේගු භූමියේ සිටම පරීක්ෂා කරනු ලබන තොග රේගුව සමග ඒකාබද්ධ පරීක්ෂණ සිදුකිරීම සඳහා ආනයනික ආහාර පරීක්ෂණ ඒකකය වෙත එවනු ලබන අතර ආහාර ද්‍රව්‍යය අනුව කලින් තීරණය කර ගෙන ඇති සාම්පල සටහන සහ සාම්පල සැලැස්ම අනුව එම තොගවල සාම්පල ලබාගැනීම සිදු කරනු ලැබේ.

තොරතුරු සංනිවේදන තාක්ෂණය හරහා ක්‍රමවේදය දියුණු කිරීමට ගෙන ඇති පියවර: ASYCUDA පද්ධතිය යටතේ වන තොරතුරු සංනිවේදන තාක්ෂණ පද්ධතියක් රේගු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ. ආනයනික ආහාර පරීක්ෂණ ඒකකවල පරිගණක සවිකර නිලධාරීන්ට මූලික පුහුණුවක් ලබා දී ඇති නමුත් මේ දක්වා එම ක්‍රමවේදය එම ඒකක වෙත ව්‍යාප්ත කර නැත. කිසියම් ප්‍රමාදයක් ඇතිවීමට හේතුවන ආකාරයේ ගැටළුවක් මතුවුවහොත් ඒ පිළිබඳව සහ නිෂ්කාශනය කඩිනම් කර ගැනීම සඳහා ආනයනකරුවන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිෂ්කාශන නියෝජිතයින් හරහා ආනයනකරුවන්ට දැනුම්දෙනු ලැබේ.

- **ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන්ද අනුමැතිය අවශ්‍ය තොග සම්බන්ධව අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ.**

1969 අංක 01 දරන ආනයන අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද 2014.01.08 දාතම දරන අංක 1844/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව ආනයන පරීක්ෂන යෝජනා ක්‍රමය මඟින් ආවරණය වන භාණ්ඩ 120ක් ඇත. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්තාවලට අනුව රේගුව වෙත ආනයනය කළ ආහාර පරීක්ෂණ ඒකකය මඟින් අවසන් නිර්දේශ ඉදිරිපත් කෙරෙන බැවින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සාම්පල ලබා ගත්තේ නම් ආනයනය කළ ආහාර පරීක්ෂණ ඒකකය සාම්පල ලබා ගැනීමෙන් වැලකී සිටී. කෙසේ වෙතත්, අවශ්‍ය වේ යැයි සිතන්නේ නම් සාම්පල ලබා ගැනීමේ අයිතිය ආනයනය කළ ආහාර පරීක්ෂණ ඒකකය තබා ගනී.

- **නීත්‍යානුකූල වෙළෙඳාමට පහසුකම් සැලසීමටත් නීත්‍යානුකූල නොවන වෙළෙඳාමට එරෙහිව ක්‍රියා කිරීමටත් තිබෙන ක්‍රියා පිළිවෙළ.**

මූලිකව නිශ්කාශන ඉල්ලුම්පත්‍රයට අමුනා ඇති ලේඛනයත් (ප්‍රභවය දැක්වෙන සහතිකය, තත්ත්ව සහතිකය, පටවනු ලබන වරාය සමීක්ෂණ සහතිකය, සෞඛ්‍ය සහතිකය, ශාක සෞඛ්‍ය සහතිකය, තොගයට අදාළ වන සුදුසු අවස්ථාවන්හිදී) ඒවායේ සත්‍යතාව තහවුරු කරගැනීම පිණිසත් අහඹු පරීක්ෂණ කළ යුතුද සවිස්තරාත්මක පරීක්ෂණ කළ යුතුද යන්න නිර්ණය කිරීම පිණිසත් සියුම් ලෙස පරීක්ෂා කරනු ලබන අතර ඊට අදාළ අවශ්‍ය පියවර ගනු ලැබේ. අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ගත් කළ ආහාර දවස්

තෙකොටසකට වෙන් කරනු ලැබේ .එනම් ,ඉහළ අවදානම් ,මැදි අවදානම් ,අඩු අවදානම් .ඉහළ අවදානම් භාණ්ඩ සියුම් පරීක්ෂණයටද ,මැදි අවදානම් භාණ්ඩ සාපේක්ෂ වශයෙන් අඩු සියුම් පරීක්ෂණයටද ,අඩු අවදානම් භාණ්ඩ අහඹු පරීක්ෂාවකටද ලක් කරනු ලැබේ .ඉහළ අවදානම් භාණ්ඩ නිරන්තරයෙන් පරීක්ෂා කිරීමේදී සතුටුදායක ප්‍රතිඵල පෙන්වන්නේ නම් ,පරීක්ෂාකාරී සෝදිසියකට පමණක් ඒවා ලක් කරනු ලැබේ .ඉහළ අවදානම් සහිත භාණ්ඩ නම් එම භාණ්ඩය සම්බන්ධ සාම්පල් ගැනීම සහ විශ්ලේෂණය තීව්‍ර කරනු ලැබේ .ආහාර පාලන පරිපාලනය කිසිදු අන්‍යෝන්‍ය ගිවිසුමක් පිළිබඳ දැනුවත් කොට නැත .අපනයනය කරනු ලබන රටවලට සම්බන්ධ විද්‍යාගාර පිළිබඳව හඳුනාගැනීමට මේ දක්වා වැඩපිළිවෙළක් නොමැත .නිර්ව්‍යාජ ආනයනකරුවන් ඔවුන්ගේ වාර්ථාවලින් රේගුව විසින් හඳුනාගනු ලබන අතර , සුදුසු ලෙස ගනුදෙනු කරනු ලැබේ.

- **ආයෝජන මණ්ඩලයෙහි සමාගම් මඟින් ආනයනය කරනු ලැබන අදාල තොග සම්බන්ධ වත්මන් තත්ත්වය.**

එම සමාගම්වල ස්වභාවය සහ ඔවුන් භුක්තිදිනු ලබන වරප්‍රසාද රේගු බලධාරින් විසින් තීරණයකරනු ලැබේ. පෙනෙන ආකාරයට සමහර තොග ඍජුවම තොග ලබන්නේ වෙත නිදහස් කරනු ලබන අතර සමහර තොග පරීක්ෂණ සඳහා **IFIU** වෙත යොමු කරනු ලැබේ. ඒමා සාමාන්‍ය පරීක්ෂාවට ලක් කරන අතර අවශ්‍ය නම් පසු විපරම් කටයුතු කරනු ලැබේ.

- **දෙපාර්තමේන්තුව මඟින් ආනයනකරුවන්ගෙන් අය කරගනු ලබන ගාස්තු**

පරීක්ෂණ ක්‍රියාවලිය සඳහා කිසිදු ගාස්තුවක් අය කරනු නොලබයි .කෙසේ වෙතත් ,පර්යේෂණාගාර විශ්ලේෂණ සඳහා සාම්පල් ලබා ගන්නේ නම් , රසායනාගාර විසින් අයකරනු ලබන ගාස්තු ආනයනකරුවන් විසින් දරනු ලැබේ.

**5. ප්‍රශ්නාවලියට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් පහත ආකාරයෙන්, පිළිතුරු සපයා තිබේ.**

- **තෝරාගත් ආනයනයන් සම්බන්ධ ප්‍රමිතිය පිරික්සීම සම්බන්ධයෙන් වන නීතිමය පදනම සහ අරමුණු මොනවාද?**

  ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි සකසනු ලැබේ .වත්මන් රෙගුලාසිය වන්නේ 2014 ,ජනවාරි 08වැනි දා පළ කරන ලද අංක 1813/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ,ආනයන )ප්‍රමිතිකරණය සහ තත්වපාලනය (රෙගුලාසි වේ .හඳුනා ගන්නා ලද භාණ්ඩය ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුගතවන බවත් ,එමඟින් පාරිභෝගිකයන් ආරක්ෂාවන බවත් සහතික කොට ගැනීම ප්‍රමිති පිරික්සීමේ අරමුණ වෙයි.

- **2015 වසරෙදි සහ 2016 වසරෙහි පළමු අර්ධයෙහි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අනුමැතිය අවශ්‍ය වූ මුළු ආනයන තොග ප්‍රමාණය කොපමණද?**

  2015 වසර - තොග 16162

  2016 ජනවාරි මස සිට ජුනි මස දක්වා - තොග 9455

- **රේගුව සහ ආනයනකරුවන් සමඟ කටයුතු කිරීමට වර්තමානයෙහි අනුගමනය කරන වත්මන් ක්‍රියාවලිය කුමක්ද? ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්ෂණය මඟින් ගෙන ඇති පියවර මොනවාද?**

  "තනි කවුළු" ක්‍රමය හඳුන්වාදීම සඳහා සඳහා අප රේගුව සමඟ කටයුතු කරන්නෙමු. රේගුව සමඟ සම්බන්ධව වීමට VPN සබඳතාවක් ස්ථාපනයකරනු ලැබූ අතර, අත්හදා බැලීම සතුටුදායකය. කෙසේ වෙතත්, CUSDECහි නොමැති, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අවශ්‍ය අතිරේක තොරතුරු ලබා ගැනීම පිණිස සහ අවශ්‍ය ලේඛන රේගුව වෙත විද්‍යුත් ලෙස යැවීම පිණිස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් වෙබ් සේවයක් අරඹන ලදී. තවදුරටත් එම ක්‍රියාවලිය දියුණු කිරීම පිණිස මෙම සතිය තුළදී එමක්‍රියාවලිය සම්බන්ධ ප්‍රතිපෝෂණයන් රේගුව වෙත සන්නිවේදනය කරනු ලැබේ.

  තවදුරටත්, දැනටමත් අරඹා ඇති ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි වෙබ් අඩවියෙහි නවීකරණ කටයුතුත් සමඟ විද්‍යුත් ගෙවීමේ ක්‍රමයක් හඳුන්වාදීම පිණිස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කටයුතු කරමින් සිටී.

  "තනි කවුළු" ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම පිණිස එම ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීමේ අවශ්‍යතාවය සහ එම ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් හඳුනාගෙන ඇති අතර අවදානම් පදනම් ප්‍රවේශය වැඩිදියුණු කරනු ලැබේ. ලෝක බැංකුවට ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් රේගුව වෙත යෝජනාවක් ඉදිරිපත් කොට තිබෙන අතර, වෙළෙඳ පහසුකම් සැලසීමේ

ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මෙම මස තුළ දූත පිරිසක් සංචාරයක යෙදීමට අපේක්ෂිතය.

- **ආහාර පනත යටතේද අනුමැතිය අවශ්‍ය තොග පිළිබඳව ඔබ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ කටයුතු කරන්නේ කෙසේද?**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන ආනයන පිරික්සුම් යටතේ ගැනෙන සමහර ආහාර ද්‍රව්‍යයන්ද ඇතුළත්ව සංඛ්‍යාත්මකව විශාල ප්‍රමාණයකින් පවතින සියලුම ආහාර නිෂ්පාදනයන්හි තත්ත්වය හා ආරක්ෂාව පිළිබඳ සහතික වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය දරන අතර, මෙම යෝජනා ක්‍රමය යටතේ ඉතා සමීප අධීක්ෂණ ක්‍රියාවලියක් ඇති කරයි. ටින් කළ මාලු ඉතා හොඳ උදාහරණයකි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආනයන පිරික්සුම් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන අතරම, ආහාර නිෂ්පාදන ශ්‍රී ලංකාවේ ප්‍රමිතියට අනුගතවන්නේදැයි පමණක් නොව ආහාර පනත යටතේ පනවා ඇති රෙගුලාසිවලට අනුගත වන්නේදැයි ඇගයීමට ලක් කරයි. එම නිෂ්පාදනයන්ට අදාළ ගැටලුවලදී (ආහාර මෙන්ම වෙනත් සහතික කරන ක්‍රම හරහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කටයුතු කරන අනෙක් නිෂ්පාදන සම්බන්ධයෙන්ද) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සමීපව කටයුතු කරයි. අවශ්‍ය අවස්ථාවලදී විශේෂ රැස්වීම් කැඳවනු ලැබේ. එමෙන්ම ද්විත්ව කරණය සිදු නොවීම සහතික කරනු වස් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. තවදුරටත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර උපදේශකත්ව කමිටුවෙහි සාමාජිකයෙකි. මෙමඟින් අවශ්‍ය ප්‍රතිපත්තිමය කරුණුද සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානයට පමුණුවනු ලැබේ.

තොග සම්බන්ධව ඕනෑම ප්‍රතික්ෂේප කිරීමක්, ගැටලුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වනු ලැබේ. ආහාර පනත යටතේ ගැනෙන නිෂ්පාදන සම්බන්ධව අවශ්‍යවන සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමැතිය ලබා ගැනීම සිදුකොට ඇති බවට රේගුව විසින් වගබලා ගනු ලැබේ.

- **නීත්‍යානුකූල වෙළෙඳාමට පහසුකම් සැලසීමටත් නීත්‍යානුකූල නොවන වෙළෙඳාම වැළැක්වීමටත් ස්ථාපනය කොට ඇති අවදානම් කළමනාකරණ ක්‍රමවේදය කුමක්ද? නීත්‍යානුකූල වෙළෙඳාමට පහසමුකම් සැලසීම පිණිස, අපනයනය කරන රටවල් සමඟ අන්‍යොන්‍යතාව හඳුනාගැනීමේ ගිවිසුම්, ක්‍රියාවලීන් තිබේද? අපනයන කරන රටවල අනුබද්ධිත විද්‍යාගාරවලින් නිකුත් කරනු ලබන සහතික හඳුනාගැනීමට ක්‍රියාවලියක් ස්ථාපනය කොට තිබේද?**

යෝජනා ක්‍රමයෙහි ප්‍රධාන අරමුණ වන්නේ භාණ්ඩ ශ්‍රී ලංකාවේ ප්‍රමිතියට අනුගත වන්නේ දැයි සහතික කිරීමත් ,ඒ අනුව පහත අවස්ථාවන්හිදී තහවුරු කර ගැනීම් පිණිස පමණක් තෝරාගත් තොගවලින් අහඹුලෙස සාම්පල ලබා

ගැනීමට යටත්ව ,නීත්‍යානුකූල වෙළෙඳාමට පහසුකම් සලසනුවත් සාම්පල ලබා ගැනීමෙන් තොරව විකිණීම පිණිස තොග නිදහස් කරනු ලැබේ .එවන් අවස්ථාවන්හිදී සාම්පල් ගැනීමෙන් අනතුරුව විකිණීම පිණිස තොග මුදාහරිනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුව අපනයනය කරන රටෙහි බලයලත් විද්‍යාගාරයකින් නිකුත් කරන ලද පරීක්ෂණ සහතිකයක් තොගයද සමඟ පවතින විට.

(ආ) අපනයනය කරනු ලබන රටෙහි සහතික කරන ප්‍රමිතිය ශ්‍රී ලංකාවෙහි ප්‍රමිතිය හා සැසඳෙන විට සහ නිෂ්පාදනය සමඟ නිෂ්පාදන සහිතකකරණ සහතිකය පවතින විට.

(ඇ) සැහීමකට පත්විය හැකි පෙර කාර්යසාධනයක් මත පදනම් වූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි ලියාපදිංචි වූ නිෂ්පාදකයෙකුගේ නිෂ්පාදනයක් වන විට සහ ISO 9001 ප්‍රමිති කළමනාකරණ ක්‍රියාවලි සහතික කරණය හෝ ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් ගත්කළ ISO 22000 ආහාර සුරක්ෂිතතා සහතිකය තිබීම.

ඉහත අවස්ථාවේදී සාම්පල ලබා ගන්නා අවස්ථා ගණන තීරණය කිරීමේදී සහ නිෂ්පාදන ලියාපදිංචිය තීරණය කිරීම පිණිස සැහීමකට පත්විය හැකි තොග ගණන නිර්ණය කිරීමේදී අවදානම් පදනම් ප්‍රවේශය යොදා ගනු ලැබේ . තවදුරටත් තොග මුදාහැරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග නිර්ණය කිරීමේදී තොග හා බැඳුණු අවදානමද සැලකිල්ලට ගනු ලැබේ .

- **ආයෝජන මණ්ඩල සමාගම් මඟින් ආනයනය කරනු ලබන අදාළ තොග සම්බන්ධයෙන් වන වත්මන් තත්ත්වය කවරේද?**

යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී පහත අවස්ථාවන් දෙක අත්දකින අතර එහි දක්වා ඇති පරිදි පියවර ගනු ලැබේ.

(අ) ප්‍රති අපනයනය පිණිස ආයෝජන මණ්ඩල සමාගම් විසින් ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය: අනුකූලතා ඇගයීමකින් තොරව මෙම නිෂ්පාදන විකිණීම පිණිස මුදාහරිනු ලැබේ.

(ආ) ආයෝජන මණ්ඩල සමාගම් ඉදිකිරීම පිණිස ගෙන්වනු ලබන නිෂ්පාදන :- ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ ගෙන්වා ඇති බව ප්‍රමාණවත් සාක්ෂි සපයා ගැනීමෙන් අනතුරුව, අහඹු ලෙස තෝරා ගන්නා ලද ව්‍යාපෘතිවලින් සාම්පල ලබා ගැනීමට යටත්ව, ආයෝජන මණ්ඩල ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසනු වස්, තත්ත්ව පරීක්ෂාවකින් තොරව තොග නිදහස් කොට තිබේ. අදාළ

පාර්ශ්වකරුවන්ගේ උපදෙස් මත, අනාගතයෙහිදී තීරණය පුනරීක්ෂණය කිරීම පිණිස එසේ එකතු කරගත් දත්ත භාවිත කරනු ලැබේ.

- **අපනයනකරුවන්ගෙන් දෙපාර්තමේන්තුව අයකර ගන්නා ගාස්තු කවරේද? එම ගාස්තු හා අදාළ ප්‍රතිපත්තිය, තාර්කික පදනම කුමක්ද?**

  දැනුම්දීම, ක්‍රියාවලිය, පිරික්සුම, ප්‍රවාහනය සහ පරීක්ෂන සඳහා ගාස්තු අය කෙරේ. නිෂ්පාදන ලියාපදිංචියට සම්බන්ධ ගාස්තු - අයදුම්පත් සම්බන්ධ කටයුතු සහ ලියාපදිංචි ගාස්තු - විද්‍යාගාර ලියාපදිංචිය සම්බන්ධ ගාස්තු - අයදුම්පත සම්බන්ධ ක්‍රියාවලිය (බලයලත් විද්‍යාගාරයක් නොවන අවස්ථාවලදී විගණනය පිණිස - වියදම් (ගුවන් ගාස්තු, නවාතැන්, විගණන ගාස්තු, රජයේ අනුමත දිනක ගාස්තු, වීසා ගාස්තු)

  ලබා දෙනු ලබන සේවාවන්ට අදාළ වියදම් පියවා ගැනීම සඳහා ගාස්තු අයකෙරේ.

**6. කාරක සභාව මඟින් යවන ලද ප්‍රශ්නාවලියට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පහත පරිදි පිළිතුරු සපයා තිබේ.**

- **2015 වසර සහ 2016 වසර මුල් භාගයෙහිදී ආයෝජන මණ්ඩලය හරහා, රේගු ප්‍රකාශනයන් යටතේ, මුළු තොග ප්‍රමාණය කුමක්ද?**

  2015 වසර සහ 2016 වසර මුල් භාගයෙහි ආයෝජන මණ්ඩලය හරහා රේගු ප්‍රකාශනයන් යටතේ මුළු ආනයන තොග ප්‍රමාණය පිළිවෙළින් 233, 320 සහ 114,169

- **2015 වසරෙහි සහ 2016 වසරෙහි මුල් භාගයෙහිදී ලේඛන තහවුරු කර ගැනීමකින්, පරීක්ෂාවකින් තොරව නිෂ්කාශනය කරන ලද මුළු ආනයනික තොග ප්‍රමාණය කොපමණද?**

  ආනයනික රේගු ප්‍රකාශනද සමඟ අවශ්‍ය සියලුම ආනයනික නැව් ලේඛනවල මුද්‍රිත පිටපත් භාරදීම ආයෝජන මණ්ඩලයෙහි සමාගම් විසින් කළ යුතුය . වර්තමානයෙහිදී ලේඛන තහවුරු කිරීමකින් තොරව කිසිදු තොගයක් නිෂ්කාශනය කළ නොහැකිය.

- **2015 වසරෙහි සහ 2016 වසරෙහි මුල් භාගයෙහිදී ලේඛන තහවුරුවකින්, පරීක්ෂාවකින් තොරව නිෂ්කාශනය කරන ලද මුළු ආයනයනික තොග ප්‍රමාණය කොපමණද?**

  2015 වසරෙහි සහ 2016 වසරෙහි මුල් භාගයේදී ලේඛන තහවුරුවකින්, පරීක්ෂාවකින් තොරව නිෂ්කාශනය කරන ලද මුළු ආනයනික තොග ප්‍රමාණය පිළිවෙළින් 12536 සහ 6,385.

- **2015 වසරෙහි සහ 2016 වසරෙහි මුල් භාගයෙහිදී නිත්‍යානුකූල නොවන ආනයනයන් ලෙස හඳුනාගත් (දැනට පර්යේෂණ පවතින ඒවාද ඇතුළුව) මුළු තොග ප්‍රමාණය කොපමණද?**

  2015 වසරේදී ආයෝජන මණ්ඩලය විසින් කිසිදු නීත්‍යානුකූල නොවන ආයනයන් හඳුනාගෙන නැති අතර 2016 වසරේදී M.S. කොන්කෝඩ් ඇපරල් (පෞද්) සමාගම විසින් ආනයනය කළ එක් ආනයනික තොගයක් හඳුනාගත් අතර ඒ සම්බන්ධයෙන් දැනට රේගුව විසින් පරීක්ෂණ පවත්වයි.

- **නීත්‍යානුකූල වෙළෙඳාමට පහසුකම් සැලසීමටත් නීත්‍යානුකූල නොවන වෙළෙඳාම වැළැක්වීමටත් ස්ථාපිත කොට ඇති අවදානම් කළමනාකරණ ක්‍රමවේදය කුමක්ද?**

  ශ්‍රී ලංකා රේගුව විසින් ආනයනයන් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කොට තිබේ .ආයෝජන මණ්ඩලය මඟින් කෙරෙන ආනයනයන්ද මෙම ක්‍රමය මඟින් ආවරණය කෙරේ.

- **"තනි කවුලු"** (single window) **ක්‍රමයෙහි වත්මන් තත්ත්වය කවරේද?**

  වර්තමානයෙහිදී "තනි කවුලු "ක්‍රමය ශ්‍රී ලංකා රේගුව මඟින් මෙහෙයවයි .ඔබේ දැන ගැනීම පිණිස EDB හි වෙළෙඳ පහසුකම් සැලසීම පිළිබඳ උපදේශක කාරක සභාව මඟින් ගරු මුදල් අමාත්‍යතුමා වෙත යවන ලද යෝජනාවක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම iii).

- **වෙනත් පනත් යටතේ (උදා : ආනයන හා අපනයන පාලන පනත) සීමාකොට ඇති ආනයනයන් හා අපනයනයන් නිෂ්කාශනය කිරීම පිණිස අනුගමනය කරන ක්‍රියා පිළිවෙත හා නීතිමය තත්ත්වය කවරේද?**

  ශ්‍රී ලංකා රේගුවෙහි ප්‍රතිපත්ති, සැලසුම් සහ පර්යේෂණ උපදේශකායතනය මඟින් ප්‍රකාශයට පත් කරන (ජාතික බදු මාර්ගෝපදේශනයෙහි හැඳින්වීමෙහි විෂයාංක 27 සහ 28 ඔබේ දැන ගැනීම පිණිස අමුණා ඇත) ජාතික බදු මාර්ගෝපදේශයෙහි ආනයන අපනයන පාලන බලපත්‍ර, අපනයන බලපත්‍ර ලෙස හඳුන්වා තිබෙන පූර්ව අනුමැතිය/ අවසරය/බලපත්‍රය ආයෝජන මණ්ඩල සමාගම් විසින්ද ලබාගත යුතුය .